හැඳින්වීම

ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ලෙස ප්‍රතිසංවිධානය කරන ලද්දේ එතෙක් පැවති සමුපකාර අධ්‍යාපන සම්ප්‍රදායයෙන් මිදී ගෝලීයකරණයට මුහුණ දියහැකි නව උපායමාර්ග හා ක්‍රමවේදයන් සපිරි අධ්‍යාපනයක් සමුපකාර ව්‍යාපාරයට ප්‍රදානය කිරීමේ අභිලාෂයෙනි.

සමුපකාර ව්‍යාපාරය මෙන්ම සමුපකාර අධ්‍යාපනය ද ගෝලීයකරණයට මුහුණ දියහැකි අයුරින් ස්වාධීනව පවත්වා ගැනීම සඳහා ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස 2001 අංක 01 දරණ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ විධිවිධාන යටතේ 2001 ජූලි මස 01 දින මෙම ආයතනය පිහිටුවන ලදි.

රජයේ ප්‍රමුඛ අමාත්‍යාංශ කිහිපයක නියෝජිතයින්ගෙන් හා රාජ්‍ය හා පෞද්ගලික අංශවල වෙනත් විද්වත් පුද්ගලයින්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් මඟින් ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම කළමනාකරණ මණ්ඩලය වෙත පැවරේ.

වෘත්තීය අධ්‍යාපනය දියුණු කිරීම තුළින් නිපුණතා සංවර්ධනය වැඩිදියුණු කිරීමටත්, ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපන හා පුහුණු ක්‍රමවේදයන්ට අනුගතවීමත් සැළකිල්ලට ගනිමින් නව ආයතනය ක්‍රියාත්මක වේ. මෙම අපේක්ෂාවන් ඉටුකරගැනීම සඳහා හිතකර වූ අධ්‍යාපනික පරිසරයක් හා ඉඩ පහසුකම් මෙම ආයතනය සතුව පැවතීම එම කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට ප්‍රබල සාධකයක් වී ඇත.

සමාලෝචිත වර්ෂය තුළ සමුපකාර අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා ඩිප්ලෝමා පාඨමාලා, සහතිකපත්‍ර පාඨමාලා හා විෂයානුබද්ධ කෙටිකාලීන පාඨමාලා සහ කළමනාකරණ සංවර්ධන පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

සභාපතිතුමාගේ පණිවිඩය

ගෝලීය ප්‍රවණතාවයන්ට ගැලපෙන පරිදි සමුපකාර ව්‍යවසාය මානව ප්‍රාග්ධන ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයෙන් 2001 වසරේ දී පරිවර්තනයකට ලක්කරන ලද වසර 70ක ඉතිහාසයක් සහිත ජාතික මට්ටමේ සමුපකාර අධ්‍යාපන ආයතනයක අනන්‍යතාවය වන ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2011 වාර්ෂික වාර්තාව වෙනුවෙන් සටහනක් තබන්නේ ගෞරවයෙනි.

මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති වැඩපිළිවෙල යටතේ අශ්චර්යමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම වෙනුවෙන් සමුපකාර ව්‍යාපාරයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා නව ප්‍රවේශයක් යටතේ පුහුණුව හා අධ්‍යාපනය විවිධාංගීකරණය කිරීමට හා අනෙකුත් සියළු පහසුකම් උසස් මට්ටමකට ගෙන ඒමටත් ඒ මගින් ආයතනික ඉපයීම් වර්ධනය කර ගැනීමට හැකිවීමත් 2011 වසරේදී අප ලද සුවිශාල ජයග්‍රහණයකි.

නිත්‍ය කාර්යභාරයෙන් ඔබ්බට ගොස් ජාතික වගකීම ඉටුකිරීම වෙනුවෙන් වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කරමින් වරලත් ගණකාධිකරණ, බැංකු, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන් හි වෘත්තීය පාඨමාලා වෙත පියනැගීම ද සුවිශේෂී වේ. එමෙන්ම ආයතනික පාඨමාලාවන් NVQ මට්ටමට සංවර්ධනය කිරීමට පියවර ගැනීමද 2011 වසරේ කඩඉමකි.

ජාතික මට්ටමේ ශ්‍රවණාගාරයක් දායාද කිරීමේ වැඩපිළිවෙල ඉදිරියට ගෙනයාම උතුරු වසන්තය, නැගෙනහිර නවෝදය හා දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් සුවිශේෂී දායකත්වයක් ලබාදීමට හැකිවීම ආයතනයේ ශක්තිය වර්ධනයවීමක් ලෙස සඳහන් කරමි. මෙම සියලු කාර්යයන්හිදී ධෛර්යයෙන් හා කැපවීමෙන් කටයුතු කරන කළමනාකරණ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ සමස්ථ කාර්ය මණ්ඩලයේ කැපවීම අගය කොට සළකමි.

භෞතික හා මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ඉදිරි පියවර රැසක් ඉටුකළ හැකිවීමටත් ඒ සෑම ක්‍රියාවලියකදීම ආසියාවේ ආශ්චර්යවත් රටක් කරා පියනැගීමට සමුපකාර ව්‍යාපාරය දිරිගැන්වීම සඳහා ආයතනය තබන සෑම පියවරක්ම සාර්ථක වේවායි එක සිතින් ප්‍රාර්ථනය කරමි.

නීතිඥ ලක්මාල් රත්නායක,
සභාපති,
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,
පොල්ගොල්ල.

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයේ මානව සම්පත සතු ධාරිතාවය ප්‍රවර්ධන කිරීම සඳහා කැපවී ඇති ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය 2001 අංක 01 දරණ පාර්ලිමේන්තු පනතින් ජාතික සමුපකාර සංවර්ධන ආයතනය නමින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් කර ආයතනයේ ව්‍යුහාත්මක වෙනස්කම් සමඟ සංවර්ධනාත්මක පසුබිම පුළුල් මට්ටමකට ගෙන එනු ලැබීය.

නව දැක්මක් සහිත සමුපකාර ව්‍යාපාරයක් තුළ කළමනාකරණ හැකියාව හා තාක්ෂණික නවීකරණයෙන් සමන්විත මානව සම්පතක් බිහි කිරීම සඳහා ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ක්‍රියාකරමින් සිටියි. මෙම වර්ෂය තුළ කොළඹ විශ්ව විද්‍යාලීය තොරතුරු තාක්ෂණ උපාධිය සඳහා සිසු පුහුණුව ආරම්භ කිරීමත් ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය යන ආයතනයන්ගේ වෘත්තීය විභාග සඳහා පුහුණු කටයුතු ආරම්භ කිරීමත් තුලින් පාඨමාලා විවිධාංගිකරණය හා භෞතික සම්පත් උපයෝජනය තවදුරටත් පුළුල් කිරීමට හැකි විය.

ව්‍යාපාරයේ විවිධ පාර්ශවකරුවන් සමඟ ඵලදායි සම්බන්ධතා ගොනුකර ගනිමින් සමස්ත සමුපකාර ව්‍යාපාරයේ අවශ්‍යතාවයන් සෘජුවම ඉලක්ක කර ගත් පුහුණු වැඩසටහන් වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කරවීම තුලින් වඩාත් ඵලදායි දායකත්වයක් මෙම ආයතනය තුලින් සමුපකාර ව්‍යාපාරයට ලබාදීමට හැකිවිය.

මෙම වර්ෂයේ ආයතනික සමස්ත කාර්ය භාරය සාර්ථක කර ගැනීම සඳහා විවිධාකාරයෙන් අනුග්‍රහය හා දායකත්වය ලබාදුන් සැමට කෘතවේදීත්වය පළකරමි.

ඩබ්. ඒ. ආර්. විමලසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,
පොල්ගොල්ල.

දැක්ම

ක්‍රි. ව. 2015 වන විට ශ්‍රී ලංකාව තුල ස්වයං පැවැත්මක් හා ස්වාධීනත්වයෙන් යුතු සමුපකාර ව්‍යවසායක් කරා පියනැගීම.

මෙහෙවර

ස්වයං පැවැත්මක් හා ස්වාධීනත්වයෙන් යුතු සමුපකාර ව්‍යවසායක් ශ්‍රී ලංකාවේ ගොඩනැගීම සඳහා අපගේ ඇල්මැති පාර්ශවකරුවන්, කාර්ය මණ්ඩලය සහ සමුපකාරිකයින් සමඟ එක්සත් භාවයෙන් හා සාමූහිකත්වයෙන් යුතුව පහසුකම් සැලසීම හා එම කාර්යය ඉටුකිරීමේදී අධ්‍යාපන, පුහුණු උපදේශකත්ව සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු නව්‍යතාවයෙන් යුතුව හා නිර්මාණශීලි ලෙස ක්‍රියාත්මක කිරීම.

අපගේ පස්විධ වටිනාකම් (Our Values)

අපගේ පස්විධ වටිනාකම්

mdßfNda.slhd wruqKq lr .eksu

සමුපකාරික ප්‍රජාව අපගේ පාරිභෝගිකයායි. ඔවුන්ගේ තත්ත්වය හෝ තරාතිරම නොබලා සැමටම එකලෙස ගෞරවය දක්වමින් අවබෝධයෙන් යුතුව සමානව සැලකීමට අපි අපේක්ෂා කරමු.

kjH;djh yd ks¾udKYS,s;ajh

සමුපකාර ව්‍යවසායේ වර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය සාධක ලෙස නව්‍යතාවය හා නිර්මාණශිලිත්වය හඳුනා ගනිමු. මේ සඳහා සමුපකාර දර්ශනය තුළ නව වැඩසටහන් හඳුන්වාදීම මගින් සහ වෙනත් නව ප්‍රවේශයන් එළිදැක්වීම තුලින් ව්‍යවසායයෙහි කාර්යසාධනය ඉහළ තලයකට ගෙන ඒම අපගේ

ld¾h uKav,hg by< jákdlula ,ndoSu

ආයතනය තුළ යෝග්‍ය වැඩ පරිසරයක් සකස් කිරීම තුළින් කාර්ය මණ්ඩල අභිප්‍රේරණ සාධක ඉහළ මට්ටමකට ගෙන ඒම සහ එමගින් ඔවුන්ගේ කාර්යඵල සඳහා වටිනාකමක් ජනිත කිරීම අපගේ තවත්

.=Kd;aul uÜgfï fiajd fnod yeÍula isÿ lsÍu

අපගේ සියළුම සේවාවන්වල ඉහළ වටිනාකමත්, විශිෂ්ට භාවයත් අප තහවුරු

iduqysl l%shdldß;ajh

හැකි උපරිම ආකාරයට ආයතනික ක්‍රියාවලිය තුළ පවතින සෑම අංශයකම පාරිභෝගිකයා අපේක්ෂිත මට්ටමේ ගුණාත්වයක් ආරක්ෂා කිරීම තුලින් හොඳ සේවා බෙදා හැරීමක් සිදු

ආයතනයේ අභිමතාර්ථ හා අරමුණු

1. ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරයේ නියුතු මානව ප්‍රාග්ධනය ඵලදායි ලෙස සංවර්ධනය කිරීම

01. සමුපකාර සංවිධානවල ඉහළ කළමනාකරණයේ වෘත්තීය මට්ටම්වල නියුතු පුද්ගලයින් සංවර්ධනය කිරීම සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු හා ක්ෂේත්‍ර චාරිකා ආදිය සංවිධානය කරමින් ඔවුන්ගේ දැනුම කුසලතා ආකල්ප ප්‍රවර්ධනය කිරීම.
02. මැද පෙළ කළමනාකරණයේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ වැඩමුළු පුහුණු පාඨමාලා හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම මගින් දැනුම කුසලතා ආකල්ප ප්‍රවර්ධනය කිරීම.
03. මෙහෙයුම් කළමනාකරණ මට්ටමේ සෑම ක්ෂේත්‍රයකම සේවකයින්ගේ දැනුම, කුසලතා, හැකියාවන් හා ආකල්ප සංවර්ධනය සඳහා වැඩමුළු හා පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.
04. රාජ්‍ය අංශයේ සමුපකාර නිලධාරින්ගේ දැනුම කුසලතා හැකියාවන් හා ආකල්ප සංවර්ධනය කිරීම.
05. දුරස්ථ අධ්‍යාපන ක්‍රම භාවිතා කිරීම.

2. සමුපකාර සංවිධානවල කාර්ය සාධනය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා දායක වීම

06. සමුපකාර ව්‍යාපාරවල ඵලදායිතාවය හා ගුණාත්මක භාවය උසස් මට්ටමකට ගෙන ඒම
07. උපදේශන සේවාවක් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම
08. ඉල්ලීම පරිදි දුර්වල ව්‍යාපාර සඳහා සායන (Business Clinic) වසරකට අවම වශයෙන් 2 බැගින් පැවැත්වීම එමගින් දුර්වලතා ඉවත්කර ගැනිමට සහාය වීම

3. සමුපකාර ව්‍යාපාරයේ ව්‍යාප්තිය හා පුනර්ජීවය සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල යෙදීම

09. සමුපකාර ව්‍යාපාරයේ සාර්ථක අත්දැකීම් හා අසාර්ථක අත්දැකීම් පිළිබඳ පර්යේෂණ කර එමගින් ලැබෙන ඵලදායි ප්‍රතිඵල සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධියට යෙදවීමට මඟපෙන්වීම.
10. සමුපකාර ව්‍යාපාරයේ සාර්ථක අත්දැකීම් පිළිබඳ වාර්තාමය චිත්‍රපට නිෂ්පාදනය කිරීම හා සපයා ගැනීම.
11. ආදර්ශ සමුපකාර ව්‍යවසායයන් ඇතිකිරීමට දායකවීම හා සමුපකාර සංකල්පය තුල කාන්තාව සවිබල ගැන්වීම හා සංවිධානය කිරීම.

4. සමුපකාර සංවර්ධනය සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කිරීම

12. සමස්ථ සමුපකාර ක්ෂේත්‍රය ආවරණය වන පරිදි තොරතුරු පද්ධතියක් හා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම.
13. සමුපකාර ව්‍යාපාරයේ සියළුම ක්ෂේත්‍රයන්ට අදාල වන පරිදි දැනුම ලබාගත හැකි අංග සම්පූර්ණ පුස්තකාල සේවාවක් පවත්වාගෙන යාම.
14. සමුපකාර කෞතුකාගාරයක් ^Cooperative Museum& ඇති කිරීම.

5. ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරය ස්ථාපිත කිරීම හා ව්‍යාප්ත කිරීම සඳහා සිවිල් සමාජය සවිබල ගැන්වීම

15. සිවිල් සමාජය තුල සමුපකාර දර්ශනය හා භාවිතයන් තහවුරු කිරීමට පියවරයන් ගැනීම.

16. සමුපකාරය පිළිබඳව අධ්‍යාපනික පුවත්පතක් හා වෙනත් ප්‍රකාශන එළිදැක්වීම.

6. දේශීය විදේශීය සමුපකාර සංවිධාන සමග අන්තර් සම්බන්ධතා ජාලයක් ගොඩනගා ගැනීම

17. මෙරට සමුපකාර ව්‍යාපාරයේ මුදුන් මට්ටමේ පවතින සමුපකාර සංවිධාන සමග සම්බන්ධතා ජාලයක් ගොඩනගා ගැනීම.
18. ජාත්‍යන්තර සමුපකාර සංධානයෙහි සාමාජිකත්වය තහවුරු කරගැනීම හා අන්තර් සම්බන්ධතා පුළුල් කොට එහි ප්‍රතිලාභ ලබා ගැනීම.
19. ලෝකයේ වෙනත් අදාල සමුපකාර සංවිධාන සමග සම්බන්ධතා ජාලයක් ගොඩනගා ගැනීම.

7. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා රාජ්‍ය නොවන අංශයන් සඳහා පහසුකම් ලබා දීම පිණිස ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සේවා විවිධාංගීකරණය කිරීම

20. පුද්ගලික අංශය සඳහා අවශ්‍ය වැඩසටහන් හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.
21. රාජ්‍ය අංශය සඳහා අවශ්‍ය නිෂ්පාදන හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.
22. රාජ්‍ය නොවන අංශය සඳහා අවශ්‍ය නිෂ්පාදන හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.

8. සමුපකාර ක්ෂේත්‍රයට විශිෂ්ඨ වු සේවාවක් ලබාදීම සඳහා ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම

23. කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම.
24. කළමනාකරණ ක්‍රියාවලිය සංවර්ධනය කිරීම.
25. බාහිර ආයතන සඳහා සේවා සැපයීම ගුණාත්මක මට්ටමින් ඉහල නැංවීම.

ආයතනයේ ප්‍රධාන කාර්යයන්

(අ) සමුපකාර සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම.

(ආ) වෙනත් දේ අතර, නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් සමුපකාර සංවර්ධනය පිළිබඳ පුහුණුව සැපයීම.

(ඇ) සමුපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

(ඈ) සමුපකාර සංවර්ධනයට සම්බන්ධ ක්‍රියාකාරකම්වල නියුක්තව සිටින තැනැත්තන් අතර අන්‍යොන්‍ය ක්‍රියාකාරකම් සහ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම.

(ඉ) සමුපකාර සංවර්ධනයට අදාල දත්ත රැස් කිරීම අරභයා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම සහ රැස් කරන ලද ඒ දත්ත ප්‍රකාශනය කිරීම මගින් සංචයනය කිරීම හා පතළ කිරීම.

(ඊ) සමුපකාර සංවර්ධනයට අදාළ විෂයයන් සම්බන්ධයෙන් ශාස්ත්‍රීය සහ පුහුණු පාඨමාලා පැවැත්වීම සහ එවැනි පාඨමාලා හදාරා නියමිත විභාගවලින් සමත්වන තැනැත්තන්ට සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරි නැමීම.

(උ) කළමනාකරණ නිපුනතා අවශ්‍ය වන සමුපකාර ව්‍යවසායයන් භාර ගෙන කළමනාකරණය කිරීම.

(ඌ) සමුපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් සැපයීම.

(එ) ආදර්ශ සමුපකාර ගම්මාන, ආදර්ශ සමුපකාර වෙළෙඳ මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය අලෙවි මධ්‍යස්ථාන පිහිටුවීම.

(ඊ) ආයතනයේ කර්තව්‍යයන්ට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පිහිටි සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

කළමනාකරණ මණ්ඩලය

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්:

i. සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස, තත් කාලයේ තනතුර දරන්නා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙකු
ii. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්
iii. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සභාපතිවරයා
iv. පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන්

i. සමුපකාර ක්ෂේත්‍රයේ පුළුල් පළපුරුද්දක් සහ කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින්, සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් තිදෙනෙක්
ii. උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, සහ
iii. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්.

ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම කළමනාකරණ මණ්ඩලයට පැවරෙන්නේය.

ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මේ පනතින් ආයතනය වෙත පවරා දී ඇති, පනවා ඇති හෝ භාරකොට ඇති බලතල කාර්ය සහ කර්තව්‍ය කළමනාකරණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතුය.

මෙයට අමතරව ආයතනයේ සම්පත්, අරමුණු හා පරමාර්ථ ලගා කර ගැනීම සඳහා මෙහෙයවමින් වාර්ෂික සංවර්ධන සැලසුම්, වාර්ෂික අයවැය ලේඛන, ඇගයීම හා අනුමත කිරීම, ප්‍රතිපත්ති සකස් කිරීම, ආයතනයේ කාර්යසාධනය කාලීනව අධීක්ෂණය කිරීම හා ඇගයීම, කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික මූල්‍ය වාර්තා හා විගණකාධිපති වාර්තා විශ්ලේෂණය කිරීම හා ඇගයීම, ප්‍රතිඵල, අපේක්ෂිත ඉලක්ක හා නොසැසඳේ නම් අපේක්ෂිත අරමුණ ලගා කර ගැනීමට අවශ්‍ය පිළියම් යෙදීම කළමනාකරණ මණ්ඩලයේ වගකීම වන්නේය.

සමාලෝචිත වර්ෂය තුල කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

1. සභාපති - නීතීඥ ඒ. එම්. ඒ. ඒ. ලක්මාල් රත්නායක මහතා, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
2. සභාපති - ඩබ්. ඒ. ආර්. විමලසිරි මහතා, අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) හා ලේඛකාධිකාරි, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (ශ්‍රී ලංකා පරිපාලන සේවය - I පන්තිය)
3. සාමාජික - ඒ. පී. පී. කිත්සිරි මහතා, (2011.08.04 දින සිට) සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් (මධ්‍යම රජය), සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

4. සාමාජික - ඒ. පී. පී. කිත්සිරි මහතා, (2011.12.16 දින සිට) අතිරේක ලේකම්, සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය
5. සාමාජික - පී. ටී. ජී. ගුණතිලක මහතා, (2011.02.15 දින සිට) අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
6. සාමාජික - බන්දුපාල රණවක මහතා, සභාපති, ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
7. සාමාජික - එච්. ජේ. ඒ. කල්දේරා මිය, අතිරේක අධ්‍යක්ෂ (සංවර්ධන) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
8. සාමාජික - පී. ධර්මදාස මහතා, (2011.10.14 දක්වා) අතිරේක ලේකම්, සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය
9. සාමාජික - පී. එච්. ආනන්ද මහතා, සමුපකාර සංවර්ධන කොමසාරිස් (වැ.බ.) (2011.07.21 දින සිට)
10. සාමාජික - කේ. එම්. එම්. ෂාකීර් මහතා
11. සාමාජික - ආර්. එම්. ප්‍රේමතිලක රත්නායක මහතා

කළමනාකරණ මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූර්ණය සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, යටත් පිරිසෙයින් මාස 3කට වරක්වත් කළමනාකරණ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය.

සමාලෝචිත වසර තුළ කළමනාකරණ මණ්ඩල රැස්වීම් 06 ක් පවත්වා ඇත.

කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිවීම පිළිබඳ විස්තර 2011

නම	රැස්වීම් පැවැත්වූ දින					
	02/28	05/06	08/04	09/09	10/14	12/16
1. ඒ.එම්.ඒ.ඒ. ලක්මාල් රත්නායක මහතා, සභාපති	✓	✓	✓	✓	✓	✓
2. ඩබ්. ඒ. ආර්. විමලසිරි මහතා, අධ්‍යක්ෂ ජනරාල්	✓	✓	ab	✓	✓	✓
3. ඒ. පී. පී. කිත්සිරි මහතා	ab	✓	ab	-	-	-
4. පී. ධර්මදාස මහතා	✓	ab	✓	✓	✓	-
5. පී. ටී. ජී. ගුණතිලක මහතා	✓	✓	✓	✓	✓	✓
6. එච්. ජේ. ඒ. කල්දේරා මහත්මිය	ab	✓	✓	✓	✓	✓
7. බන්දුපාල රණවක මහතා	ab	ab	ab	✓	ab	ab
8. කේ. එම්. එම්. ෂාකීර් මහතා	ab	✓	✓	✓	ab	✓
9. ආර්. එම්. ප්‍රේමතිලක රත්නායක මහතා	✓	✓	✓	✓	✓	✓
10. පී. එච්. ආනන්ද මහතා (2011/07/21 වන දින සිට)	-	-	-	✓	✓	✓
11. ඒ. පී. පී. කිත්සිරි මහතා (නැවත පත් කිරීමට අදාල දිනයක් දන්වා නොමැත)	-	-	-	-	-	✓

✓ - කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිත්වය

ab - කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා නොපැමිණීම

\- - කළමනාකරණ මණ්ඩල සාමාජිකත්වය නොමැත

අධ්‍යයන මණ්ඩලය

ආයතනයේ අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

(අ) අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාය

(ආ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල නියෝජිතයෙක්,

(ඇ) විභාග කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්,

(ඈ) සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්, සහ

(ඉ) අමාත්‍යවරයාගේ මතය අනුව, කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහ පුහුණුව ලබා ඇත්තා වූ සමුපකාර අංශයෙන් හෝ පෞද්ගලික අංශයෙන් තෝරා ගනු ලබන තැනැත්තෙකු.

ආයතනයේ පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අධ්‍යයන මණ්ඩලය පත් කරනු ලබන අතර සමාලෝචිත වසර තුළ අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

1. ඩබ්. ඒ. ආර්. විමලසිරි මහතා	-	සභාපති අධ්‍යක්ෂ ජනරාල්, (වැ.බ.) ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.
2. ආචාර්ය විජිත නානායක්කාර මහතා	-	සාමාජික, ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
3. ඩබ්. එම්. ආනන්ද මහතා	-	සාමාජික, සමුපකාර සංවර්ධන කොමසාරිස්, මධ්‍යම පළාත, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, මහනුවර.
4. අනුර එදිරිසිංහ මහතා	-	සාමාජික, විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල.
5. ඩබ්. ඒ. ආර්. විමලසිරි මහතා	-	ලේකම්, ලේඛකාධිකාරි, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල.

අධ්‍යයන මණ්ඩලයේ කාර්යයන්

(අ) ආයතනය සඳහා පුහුණු හා පර්යේෂණ වැඩ සටහන් සකස් කිරීම.

(ආ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධනය කිරීම.

(ඇ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන විභාග සඳහා නිර්දේශ පත්‍රිකා සකස් කිරීම සහ අනුමත කිරීම, විභාග අධීක්ෂණය කිරීම සහ ආයතනයේ අධ්‍යාපන පුහුණු වැඩසටහන් ඇගයීමට අදාළ යෝජනා ක්‍රම පිළියෙල කිරීම.

(ඈ) ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල ප්‍රතිඵල කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව නිකුත් කිරීම සහ,

(ඉ) ශිෂ්‍යත්ව, නිල ලාංඡන සහ වෙනත් ප්‍රදානයන් ප්‍රදානය කිරීමට අදාළ විය යුතු කොන්දේසි නියම කිරීම.

සමාලෝචිත වර්ෂයේ 2011.09.14 දින අධ්‍යයන මණ්ඩල රැස්වීම පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර මෙදින පාඨමාලා 06ක පළමුවර විභාග ප්‍රතිඵල හා ඌනසමත් අපේක්ෂකයන් වෙනුවෙන් පැවැත්වූ නැවත විභාග 10කට අදාල ප්‍රතිඵල සමඟ සම්පූර්ණ ප්‍රතිඵල ලේඛන 16ක් ඉදිරිපත් කරන ලදී. එහි විස්තර පහත පරිදි වේ.

අ. 2011.09.14 දින පවත්වන ලද අධ්‍යයන මණ්ඩල රැස්වීම

පළමුවරට පැවැත්වූ විභාග					
පාඨමාලාව	**පාඨමාලාව සඳහා සහභාගි වූ සංඛ්‍යාව**	**සමත් සංඛ්‍යාව**	**ඌන සමත් සංඛ්‍යාව**	**අසමත් සංඛ්‍යාව**	**පාඨමාලාව අතහැර ගිය සංඛ්‍යාව**
1. සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව(2009/2010)	48	41	06	-	01
2. සමුපකාර සංවර්ධන උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2008)	08	07	01	-	-
3. සමුපකාර සංවර්ධන උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2006)	01	01	-	-	-
4. බැංකු කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව (2009)	21	20	01	-	-
5. වෘත්තිකයන් සඳහා ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව - 2010	18	12	-	-	06
6. ඉංග්‍රිසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - 2011	17	08	01	-	08
නැවත විභාග 7. මානව සම්පත් කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2008)	03	02	01	-	-
8. ගණකාධිකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2006/2007)	01	01	-	-	-
9. බැංකු කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2008/2009)	03	02	01	-	-
10. සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව (2007)	07	02	05	-	-
11. සුළු මූල්‍ය උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2007)	01	01	-	-	-
12. ගණකාධිකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2007)	01	01	-	-	-
13. ගණකාධිකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2008)	11	10	01	-	-
14. සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව (2009)	07	06	01	-	-
15. සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව 2003/2004	01	01	-	-	-
16. සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව 1998	01	01	-	-	-
එකතුව	**149**	**116**	**18**	**-**	**15**

කාර්ය මණ්ඩලය

අප ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 59 කි. 2011 දෙසැම්බර් 31 දිනට ආයතනය තුල නියුක්ත සේවක සංඛ්‍යාව 36ක් විය. එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 23කි. මෙම පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය මුලික කටයුතු දැනට සම්පාදනය වෙමින් පවතී.

2011.12.31 දිනට අනුමත තනතුරු හා සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

අනු අංකය	තනතුර	තනතුරු ප්‍රමාණය	සිටින නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු
1.	අධ්‍යක්ෂ ජනරාල්	01	-	01
2.	ලේඛකාධිකාරි	01	01	-
3.	අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන)	01	-	01
4.	කථිකාචාර්ය	06	04	02
5.	පුස්තකාලයාධිපති	01	01	-
6.	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මූල්‍ය)	01	01	-
7.	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුද්‍රණ)	01	-	01
8.	නේවාසිකාගාර කළමනාකරු	01	01	-
9.	සහකාර ලේඛකාධිකාරි	01	01	-
10.	ව්‍යාප්ති නිලධාරි	01	-	01
11.	පරිගණක වැඩසටහන් නිලධාරි	01	01	-
12.	සහකාර කථිකාචාර්ය	06	03	03
13.	සහකාර නේවාසිකාගාර කළමනාකරු	01	01	-
14.	සහකාර පුස්තකාලයාධිපති	01	01	-
15.	කළමනාකරණ සේවා සහකාර (උපාධිධාරි)	12	06	06
16.	පරිගණක උපදේශක	03	01	02
17.	පරිගණක වදන් සැකසුම්කරු	01	01	-
18.	කළමනාකරණ සේවා සහායක	05	01	04
19.	ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු	01	01	-
20.	ශ්‍රව්‍ය දෘෂ්‍ය යන්ත්‍ර ක්‍රියාකරු	01	01	-
21.	සංචාරක බංගලා භාරකරු	01	01	-
22.	රියදුරු	04	04	-
23.	සේවා සහායක	07	05	02
	එකතුව	**59**	**36**	**23**

මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ පසුගිය වසර 5ක කාල පරිච්ඡේදය සම්බන්ධව ආදායම්, වියදම්, භාණ්ඩාගාර ප්‍රදාන සංක්ෂිප්තව පහත පරිදි දැක්විය හැක.

2007 - 2011 වර්ෂය දක්වා ආදායම

විස්තරය	2007	2008	2009	2010	2011
1. පාඨමාලා ගාස්තු	7,457,997	5,999,038	5,594,102	8,320,364	7,889,115
2. නේවාසිකාගාර, දේශන ශාලා හා නිල නිවාස ගාස්තු	3,957,200	6,390,476	6,130,260	6,543,381	8,057,757
3. සේවා ගාස්තු	793,779	1,730,750	1,158,914	-	-
4. ආහාර සැපයීම් මත කොමිස් මුදල්	610,177	1,284,315	972,492	805,864	999,972
5. මුද්‍රණ සේවා හා ප්‍රකාශන අලෙවි ගාස්තු	84,052	155,285	387,932	395,727	405,768
6. කාර්යසාධන තරගාවලිය සඳහා ලියාපදිංචි ගාස්තු	-	-	-	1,225,600	-
7. ස්ථාවර වත්කම් විකුණුම් ආදායම	-	-	-	1,144,039	1,060,830
6. වෙනත් ආදායම්	1,507,334	1,692,359	1,607,621	2,209,656	3,007,189
මුළු එකතුව	**14,410,539**	**17,252,223**	**15,851,319**	**20,644,631**	**21,420,631**



2011 වර්ෂයේදී ජාතික සමුපකාර සංවර්ධන ආයතන ආදායම රුපියල් මිලියන 21.42ක් වන අතර එම ආදායම අංශ අනුව පහත පරිදි දැක්විය හැක.



2007 - 2011 වර්ෂය දක්වා වියදම

විස්තරය	2007	2008	2009	2010	2011
1. වැටුප් හා වේතන, දේශන ගාස්තු, අනෙකුත් ගාස්තු	16,365,336	17,535,359	18,445,338	19,512,564	20,323,326
2. ගමන් වියදම්	617,452	542,174	623,357	753,427	1,503,396
3. සැපයුම් හා කාර්යාලීය අවශ්‍යතා	3,843,495	3,775,773	2,896,742	3,902,331	4,020,919
4. නඩත්තු වියදම්	1,452,350	1,838,114	1,686,323	2,405,953	3,125,426
5. ගිවිසුම්ගත සේවා	6,094,609	8,130,603	8,969,645	9,206,898	12,751,894
6. අනෙකුත්	708,115	622,995	1,513,243	-	-
අ) කාර්ය සාධන තරගාවලිය සඳහා වු වියදම්	-	-	-	2,458,531	-
ආ) ජාතිය ගොඩනැගීමේ බදු	-	-	-	829,082	429,394
ඇ) විවිධ වියදම්	-	-	-	967,970	733,302
මුළු වියදම	**29,081,357**	**32,445,018**	**34,134,648**	**40,036,756**	**42,887,657**



2007 - 2011 කාලය තුල භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන

විස්තරය	2007 රු.	2008 රු.	2009 රු.	2010 රු.	2011 රු.
ප්‍රාග්ධන ප්‍රතිපාදන	37,160,000	19,500,000	49,400,000	70,200,000	2,000,000
පුනරාවර්තන ප්‍රතිපාදන	13,135,738	19,680,000	21,470,211	22,390,000	22,743,582

2007-2011 වර්ෂය තුල ආයතනික ඉපයීම්, වියදම් හා ප්‍රතිපාදන

විස්තරය	2007	2008	2009	2010	2011
1. ආයතනික ඉපයීම්	14,410,539	17,252,222	15,851,319	20,644,631	21,420,631
2. වියදම	29,081,357	32,445,018	34,134,648	40,036,756	42,887,657
ප්‍රතිපාදනවලට පෙර ඌනතාවය	(14,670,818)	(15,192,795)	(18,283,329)	(19,392,125)	(21,467,026)
3. පුනරාවර්තන ප්‍රතිපාදන(භාණ්ඩාගාර ප්‍රතිපාදන හා මහජන බැංකු ආධාර)	13,645,738	19,680,000	21,470,211	22,390,000	22,743,582
ප්‍රතිපාදනවලින් පසුව මෙහෙයුම් (ඌනතාවය) අතිරික්තය	(1,025,080)	4,487,205	3,186,882	2,997,875	1,276,556

2007-2011 වර්ෂය තුල ලද භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන හා ලැබීම් හා යෙදවීම

විස්තරය	2007	2008	2009	2010	2011
ප්‍රාග්ධන ප්‍රදාන පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය	6,091,161	1,060,354	-	10,484,405	31,521,228
ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම්	37,160,000	19,500,000	49,400,000	70,200,000	2,000,000
මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදන මුදල්	**43,251,161**	**20,560,354**	**49,400,000**	**80,684,405**	**33,521,228**
ප්‍රාග්ධන ප්‍රදාන යෙදවීම්					
(අ) නිවාස නිකේතනය, මුළු තැන්ගෙය භෝජනාගාරය, දේශනශාලා කාර්යාල පද්ධතිය, නේවාසිකාගාර වැඩි දියුණුකිරීම	18,577,542	7,268,108	-	-	-
(ආ) බහුකාර්ය ගොඩනැගිල්ල දෙවන අදියර හා අවසන් අදියර ඉදිකිරීම	8,616,079	10,632,028	9,242,800	2,178,133	46,500
(ඇ) ආයතනයේ ගොඩනැගිල්ල සඳහා විදුලි රැහැන් ඇද විදුලිය සැපයීම	2,578,033	-	-	-	-
(ඈ) බහුකාර්ය ගොඩනැගිල්ලට හා ශ්‍රවනාගාර ගොඩනැගිල්ලට විදුලිය සැපයීම සඳහා ට්‍රාන්ස්පෝමරය සවිකිරීම	-	-	2,272,795	-	-
(ඉ) ලී බඩු කාර්යාල උපකරණ පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම	6,629,092	1,036,758	1,000,000	8,374,044	725,956
(ඊ) ශ්‍රවනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම	175,000	344,484	26,400,000	38,611,000	5,367,136
(උ) ආයතන භූමියේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම හා භූමිය වටා වැටක් ඉදිකිරීම	5,615,061	1,278,976	-	-	-
මුළු වියදම	**42,190,807**	**20,560,354**	**389,915,595**	**49,163,177**	**6,139,592**
ඉදිරියට ගෙන ගිය ඉතිරි මුදල	1,060,354	-	10,484,405	31,521,228	27,381,636

අධ්‍යයන කටයුතු පිළිබඳ තොරතුරු

ආයතනය මඟින් සංවිධානය කළ පාඨමාලා පිළිබඳ ප්‍රගතිය 2007 - 2011

පාඨමාලා	2007		2008		2009		2010		2011	
	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
ඩිප්ලෝමා	8	142	7	124	2	55	08	142	09	181
සහතික පත්‍ර	4	90	3	103	4	124	05	156	05	97
කෙටිකාලීන	51	1756	36	1051	37	1331	64	2738	36	1413
එකතුව	**63**	**1988**	**46**	**1278**	**43**	**1510**	**77**	**3064**	**50**	**1691**



පෙර වර්ෂ හා සැසඳීමේදී සමාලෝචිත වසර තුළ ආයතනය මගින් සංවිධානය කරන ලද ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලාවල හා කෙටිකාලීන කළමනාකරණ සංවර්ධන වැඩසටහන්වල සාපේක්ෂව ඉහළයාමක් පෙන්නුම් කර ඇත. මේ සඳහා ප්‍රබල ලෙස බලපා ඇත්තේ සමුපකාර ව්‍යාපාරයේ අවශ්‍යතාවයන් හඳුනාගෙන ඒ අනුව පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීමට ආයතනය කටයුතු කිරීමයි.

බාහිර ආයතනවල ඉල්ලීම් අනුව සංවිධානය කරන ලද පාඨමාලා 2007 - 2011

වර්ෂය	2007	2008	2009	2010	2011
පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව	377	368	329	255	329
සහභාගි වූ මුළු සංඛ්‍යාව	20925	21439	16715	19852	16955

ආයතනයේ භෞතික සම්පත් සංවර්ධනය මෙන්ම පරිපාලනමය සංශෝධන තුළින් බාහිර පාර්ශවයන් තෘප්තිමත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි. මේ නිසා පසුගිය වර්ෂ කිහිපය තුළ අප ආයතනයේ පුහුණු පහසුකම් අපේක්ෂාවෙන් පැමිණි ආයතනවල කැපී පෙනෙන වර්ධනයක් අත්කර ගැනීමට හැකි වී ඇත.

1. මානව සම්පත් සංවර්ධනය

ආයතනයේ ප්‍රමුඛතම කාර්ය වනුයේ සමුපකාර ව්‍යාපාරයේ මානව සම්පත සංවර්ධනය කිරීමයි. මෙම අරමුණ මුල් කොටගෙන සමාලෝචිත වසර තුල සමුපකාර අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා හා විෂයානු බද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරි පුහුණුව

(අ) සමුපකාර සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

මෙය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට බඳවා ගනු ලබන සමුපකාර සංවර්ධන නිලධාරීන්ගේ කඩඉම් පරීක්ෂණයක් ලෙස පැවැත්වෙන උසස් ඩිප්ලෝමා පාඨමාලාවකි. දිවයිනේ විවිධ පළාත්වල සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව අවසන් කර ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබා සිටි නිලධාරීන් සඳහා 2011 මැයි මාසයේදී මෙම පාඨමාලාව සඳහා 26 දෙනෙකු බඳවා ගෙන අධ්‍යයන කටයුතු සිදු කර සියලු විභාග පවත්වා සමාලෝචිත වසරේ නොවැම්බර් මාසයේදී පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරීන් සඳහා පවත්වන ලද උසස් ඩිප්ලෝමා පාඨමාලා හා පුහුණුලාභීන් පිළිබඳ සංෂිප්ත වාර්තාව පහත පරිදි වේ.

වර්ෂය	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ මුළු සංඛ්‍යාව
2007	1	41
2008	1	9
2011	1	26

2009 හා 2010 වර්ෂවල මෙම පාඨමාලාව පවත්වා නොමැත.

(ආ) සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

මෙය සමුපකාර සංවර්ධන නිලධාරීන්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම හා සේවය ස්ථිර කිරීම සඳහා සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් පැවැත්වෙන පාඨමාලාවකි. සබරගමුව හා උතුරු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු මඟින් බඳවාගන්නා ලද නවක සමුපකාර සංවර්ධන නිලධාරීන් 51

දෙනෙකු 2010.11.01 දින මෙම පාඨමාලාවට බඳවාගෙන පුහුණුව ලබාදීමට කටයුතු කරන ලදී. එම පාඨමාලාවේ පළමු වාරයේ අධ්‍යයන කටයුතු 2011.03.16 දින අවසන් කර එහි දෙවන වාරයේ අධ්‍යයන කටයුතු 2011.09.04 දින ආරම්භ කර 2012.04.06 දින එම සහතික පත්‍ර පාඨමාලාවට අදාල සියලු විභාග පවත්වා පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී.

එමෙන්ම දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා ලද නවක සමුපකාර සංවර්ධන නිලධාරීන් 33 දෙනෙකු නැවත 2011 වසරේ මාර්තු මස සහතික පත්‍ර පාඨමාලාවට බඳවා ගෙන ඔවුන්ගේ අධ්‍යාපන කටයුතුවල පළමු වාරය 2011 ජුනි මස අවසන් කරන ලදී.

පුහුණු පාඨමාලාව	ආරම්භක දිනය	අවසන් කළ/අවසන් කිරීමට නියමිත දිනය	සහභාගි වූ සංඛ්‍යාව
1. සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සබරගමුව හා උතුරු පළාත්)	2010.11.01	2012.04.06	51
2. සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (දකුණු පළාත)	2011.04.04	2011.08.19	33
එකතුව			**84**

2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා මෙම ආයතනය මගින් පවත්වන ලද වෙනත් සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව හා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.

වර්ෂය	විස්තරය	
	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ මුළු සංඛ්‍යාව
2007	01	41
2008	සහතික පත්‍ර පාඨමාලා පවත්වා නැත	
2009	02	95
2010	01	51
2011	01	33

1.2 සමුපකාරය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා

සමාලෝචිත වසර තුළ දී සමුපකාර ව්‍යාපාරයේ වෘත්තිකයන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ඩිප්ලෝමා පාඨමාලා 06ක් ආරම්භ කර පවත්වන ලද අතර 2010 වර්ෂය තුළ ආරම්භ කරන ලද එවැනිම ඩිප්ලෝමා පාඨමාලා 07ක අධ්‍යයන කටයුතු 2011 වර්ෂයේදී අවසන් කරන ලදී. එහි විස්තර පහත පරිදි වේ.

පුහුණු පාඨමාලාව	ආරම්භක දිනය	අවසන් කළ/අවසන් කිරීමට නියමිත දිනය	සහභාගි වූ සංඛ්‍යාව
1. විගණන ඩිප්ලෝමා පාඨමාලාව 2011/2012	2011.09	2012 අගෝස්තු	21
2. බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2011/2012	2011.10	2012 සැප්තැම්බර්	23
3. ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2011/2012	2011.12	2012 නොවැම්බර්	22
4. මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2011/2012	2011.10	2012 සැප්තැම්බර්	18
5. සුළු මූල්‍යකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2011/2012	2011.10	2012 සැප්තැම්බර්	14
6. ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2011/2012	2011.10	2012 සැප්තැම්බර්	23
එකතුව			**121**

2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා මෙම ආයතනය මගින් පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව හා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.

වර්ෂය	විස්තරය	
	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ මුළු සංඛ්‍යාව
2007	4	85
2008	5	93
2009	1	21
2010	07	119
2011	06	121



1.3 සමුපකාරය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා

සමාලෝචිත වසරේ සැප්තැම්බර් මාසයේදී බැංකු හා මූල්‍ය කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ කර එහි අධ්‍යයන කටයුතු 2012 අප්‍රේල් මාසයේදී සාර්ථකව අවසන් කරන ලදී. පුහුණුලාභීන් සංඛ්‍යාව 15 කි.

2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා මෙම ආයතනය මගින් පවත්වන ලද සමුපකාර සහතික පත්‍ර පාඨමාලාවල ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.

වර්ෂය	විස්තරය	
	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ මුළු සංඛ්‍යාව
2007	2	26
2008	1	27
2009	1	22
2010	2	49
2011	1	15



1.4 විෂයානුබද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන්

වාර්ෂිකව මෙම ආයතනය විසින් සමුපකාර ක්ෂේත්‍රයේ නියුතු සමුපකාර සමිති නායකයින්, සේවකයින් හා සමුපකාර දෙපාර්තමේන්තුවලට අනුයුක්ත නිලධාරීන් හා විභව සමුපකාර නායකයින් ඉලක්ක කොටගෙන විවිධ ක්ෂේත්‍රයන්ට අදාළව කෙටිකාලීන කළමනාකරණ හා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් රැසක් සංවිධානය කරනු ලැබේ.

ඒ අතර මෙම ආයතනය විසින්ම සැලසුම් කළ වැඩසටහන් මෙන්ම විවිධ සමුපකාර සංවිධානවල ඉල්ලීම හා අවශ්‍යතාවය ද පදනම් කොටගෙන මෙම පුහුණු පාඨමාලා සංවිධානය කරනු ලැබේ. ඒ අනුව සමාලෝචිත වසර තුළ පහත සඳහන් පරිදි අදාළ පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.

වර්ෂය	විස්තරය	
	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වු මුළු සංඛ්‍යාව
2007	53	1756
2008	36	1051
2009	37	1331
2010	64	2738
2011	36	1413

ආයතනය විසින් සංවිධානය කරන ලද කෙටිකාලීන කළමනාකරණ පුහුණු පාඨමාලා

පාඨමාලාවේ නම	පැවැත්වූ දින	පුහුණුලාභීන් සංඛ්‍යාව
1. ලේකම් පරිචය පිළිබඳ පුහුණු වැඩසටහන	2011.03.04-06	29
2. කෝප් සිටි වෙළඳ සල් සවිබල ගැන්වීම සඳහා උපාය මාර්ගික අලෙවි කළමනාකරණය	2011.03.05-06	31
3. නිර්මාණශීලී සමුපකාර කළමනාකරණය සඳහා වන වැඩමුළුව	2011.10.03-04	46
4. ව්‍යාපෘති කළමනාකරනය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව	2011.05.21-22	13
5. ග්‍රාමීය බැංකු කළමනාකරුවන්ගේ භූමිකා සංවර්ධනය පිළිබඳ පාඨමාලාව	2011.09.23-25	41
6. ග්‍රාමීය බැංකු ලිපිකරුවන්ගේ කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන	2011.11.14-16	27
7. පිරිස්බල තක්සේරු සකස් කිරීම පිළිබඳ පාඨමාලාව	2011.11.18-20	26
8. ග්‍රාමීය බැංකු ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ පාඨමාලාව	2011.12.09-11	25
9. සමුපකාර සමිතිවල සාමාන්‍යාධිකාරිවරුන් සඳහා වෘත්තීය කළමනාකරණ කුසලතා සංවර්ධන පාඨමාලාව	2011.10.17	20
10. කෝප් සිටි, මිනිකෝප් සිටි වෙළඳ සල් සවිබල ගැන්වීම සඳහා පුහුණු වැඩසටහන	2011.12.21-22	36
11. තිරසාර මූල්‍ය ආයතනයක ණය කළමනාකරණය පිළිබඳ පාඨමාලාව	2011.12.03-04	48
12. මූලික පරිගණක පුහුණු පාඨමාලාව	2011.06.25 2011.07.09 2011.07.16	09
එකතුව		**351**

සමුපකාර ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා නොමිලේ සහ සහනදායි ප්‍රවේශය යටතේ පවත්වන ලද පාඨමාලා

සමාලෝචිත වසර තුල සමුපකාර ක්ෂේත්‍රයේ සංවිධානවල කාර්ය මණ්ඩලවල කළමනාකරණ කුසලතාව වර්ධනය කිරීමේ අරමුණින් කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් 24ක් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා මුල්‍ය ප්‍රතිපාදන මහජන බැංකුවේ සමුපකාර අරමුදලින් හා රජයේ ඒකාබද්ධ අරමුදලින් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල විස්තර පහත පරිදි වේ.

මහජන බැංකු ආධාර යටතේ පවත්වන ලද පාඨමාලා

පාඨමාලාවේ නම	පැවැත්වූ දින	පුහුණුලාභීන් සංඛ්‍යාව
1. අම්පාර දිස්ත්‍රික්කයේ සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික හා විධායක නිලධාරි පුහුණුව	2011.11.07-08	56
2. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සමුපකාර සමිතිවල විධායක නිලධාරින්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන	2011.12.13-16	43
3. යාපනය දිස්ත්‍රික්කයේ සමුපකාර සමිතිවල විධායක නිලධාරින්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන	2011.12.15-16	49
4. වව්නියාව හා මන්නාරම දිස්ත්‍රික්කයේ සමුපකාර සමිතිවල විධායක නිලධාරින්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන	2011.12.29-30	49
5. පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වූ පුහුණු වැඩමුළුව	2011.10.06-07	39
එකතුව		**236**

භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද පාඨමාලා

පාඨමාලාවේ නම	පැවැත්වූ දින	පුහුණුලාභීන් සංඛ්‍යාව
1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ තෙදින වැඩමුළුව (පළමු වැඩසටහන)	2011.11.21-23	54
2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ තෙදින වැඩමුළුව (දෙවන වැඩසටහන)	2011.12.15-17	46
3. විගණකවරුන්ගේ භූමිකා සංවර්ධනය	2011.12.27-28	44
එකතුව		**144**

බාහිර ඉල්ලීම් මත පවත්වන ලද පුහුණු වැඩසටහන්

පාඨමාලාවේ නම	පැවැත්වූ දින	පුහුණුලාභීන් සංඛ්‍යාව
1. උසස් පරිගණක පුහුණු වැඩසටහන (උඩරට ගැමි පුනරුත්ථාපන)	2011.04.22 2011.04.30 2011.05.07	13
2. උසස් පරිගණක පුහුණු පාඨමාලාව	2011.02.12 2011.06.18	23
3. අධ්‍යක්ෂ මණ්ඩල පුහුණු වැඩමුළුව	2011.06.17	19
4. විශේෂ විමර්ශන පැවැත්වීම පිළිබඳ දෙදින වැඩමුළුව	2011.06.04-05	25
5. සී/ස බෙරලපනාතර වි. සේ.ස. මහ සභා පුහුණුව	2011.05.28-29	68
6. මහවැලි අධිකාරියේ ගොවි නියෝජිත පුහුණුව	2011.07.23-25	57
7. මහවැලි අධිකාරියේ ගොවි සංවිධාන විගණන පුහුණුව	2011.07.11-15	26
8. සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සේවක මණ්ඩල පුහුණු වැඩසටහන	2011.10.26	16
9. මධ්‍යම පළාතේ කර්මාන්ත අමාත්‍යාංශය මෙහෙයවන තරුණ පුරෝගාමීන් සඳහා නායකත්ව හා කළමනාකරණ පුහුණු වැඩසටහන	2011.08.29-30	40
එකතුව		**287**

දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව උතුරු මැද පළාතේ පැවැත්වූ පුහුණු වැඩසටහන්

වැඩසටහනේ නම	පැවැත්වූ දින	පුහුණුලාභීන් සංඛ්‍යාව
01. අනුරාධපුර දිස්ත්‍රික් සණස කාරක සභා පුහුණුව	2011.10.20	54
02. අනුරාධපුර දිස්ත්‍රික් සණස කාරක සභා පුහුණුව	2011.10.21	140
03. අනුරාධපුර දිස්ත්‍රික් කෝප් සිටි/ මිනි කෝප්සිටි කළමනාකරුවන්ගේ ධාරිතා ප්‍රවර්ධනය	2011.12.07	51
04. අනුරාධපුර දිස්ත්‍රික් කෝප් සිටි/ මිනි කෝප්සිටි කළමනාකරුවන්ගේ ධාරිතා ප්‍රවර්ධනය	2011.12.07	22
05. පොළොන්නරුව දිස්ත්‍රික් කෝප් සිටි/මිනි කෝප්සිටි කළමනාකරණ ධාරිතා ප්‍රවර්ධනය	2011.12.20	49
06. පොළොන්නරු දිස්ත්‍රික් වි.සේ. ස. සමිති අධ්‍යක්ෂ මණ්ඩල පුහුණුව	2011.12.20	30
07. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වි.සේ.ස. සමිතිවල වාණිජ කළමනාකරු, සභාපති, බැංකු සේවා කළමනාකරු ආකල්ප සංවර්ධන පුහුණුව	2011.12.27	49
එකතුව		**395**

වෙනත් ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා හා වෘත්තීය පාඨමාලා

රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් හා රජයේ සේවකයන් සඳහා පරිගණක දැනුම, තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රිසි දැනුම ලබාදීම අරමුණු කරගෙන මෙම ඩිප්ලෝමා පාඨමාලා සහ සහතික පත්‍ර පාඨමාලා ක්‍රියාත්මක කරන ලදී.

1. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

මෙම පාඨමාලාව පාසැල් අධ්‍යාපනය අවසන් කර රැකියා අපේක්ෂිතව සිටින තරුණ තරුණියන්ට ඔවුන්ගේ තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුම වැඩිදියුණු කරගැනීමට හැකිවන පරිදි සැලසුම් කරන ලද හය මාසික පූර්ණ කාලීන තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවකි. සමාලෝචිත වසර තුල පූර්ණ කාලීන හා අර්ධ කාලීන වශයෙන් ඩිප්ලෝමා පාඨමාලා 02ක් ආරම්භ කර පවත්වනු ලැබූ අතර 2010 වසර තුල ආරම්භ කරන ලද එවැනිම ඩිප්ලෝමා පාඨමාලාවක අධ්‍යයන කටයුතු මෙම වසර තුල අවසන් කිරීමට හැකිවිය. එහි තොරතුරු පහත වගුවේ දැක්වේ.

පාඨමාලාවේ නම	ආරම්භක දිනය	අවසනකළ/අවසන් කිරීමට නියමිත දිනය	පුහුණුලාභීන් සංඛ්‍යාව
1. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව 2010/2011	2010.09.15	2011.05.15	23
2. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව 2011/2012	2011.09.15	2012.04.30	27
3. තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව 2011/2012 අර්ධකාලීන	2011.06.04	2012.07.30	07
එකතුව			**57**



2. පරිගණක සහතික පත්‍ර පාඨමාලාව

මෙම පාඨමාලා අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටි සිසුන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ පරිගණක භාවිතය පිළිබඳ දැනුම වැඩිකර ගැනීම සඳහා සකස් කරන ලද පාඨමාලාවක් වන අතර සමාලෝචිත වසර තුල සහතික පත්‍ර පාඨමාලා 02ක් ආරම්භ කර සාර්ථකව අවසන් කර ඇත. මෙම පාඨමාලා මගින් සිසුන් 32 දෙනෙකු පුහුණු කරන ලදී.

පාඨමාලාවේ නම	ආරම්භක දිනය	අවසන් කළ දිනය	පුහුණුලාභීන් සංඛ්‍යාව
1. පරිගණක අධ්‍යයනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	2011.01.20	2011.05.16	25
2. ජාවා පිළිබඳ පරිගණක පාඨමාලාව	2011.03.12	2011.09.24	07
එකතුව			**32**

3. ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව

පාසල් හැරගිය තරුණ තරුණියන් හා රැකියා නියුක්තිකයන් ඉලක්ක කරගනිමින් ඔවුන්ගේ ඉංග්‍රිසි දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ඉංග්‍රිසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා 02ක් වර්ෂය තුල පවත්වන ලදී. එක් පාඨමාලාවක් 2010 වර්ෂයේ ආරම්භ කර 2011 වර්ෂයේදී අවසන් කළ අතර අනෙක් පාඨමාලාව සමාලෝචිත වසර තුල ආරම්භ කර 2012 වර්ෂයේදී අවසන් කරන ලදී. එහි විස්තර පහත පරිදි වේ.

පාඨමාලාවේ නම	ආරම්භක දිනය	පුහුණුලාභීන් සංඛ්‍යාව
1. ඉංග්‍රිසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	2010.10	17
2. වෘත්තිකයන් සඳහා ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව	2011.10.02	17
එකතුව		**34**

4. වෘත්තීය පාඨමාලා

2011 වර්ෂයේදී කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන ආයතනය සමග අනුබද්ධ වී එම ආයතනය මගින් පවත්වනු ලබන තොරතුරු තාක්ෂණවේදී උපාධි පාඨමාලාව සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී.

ඒ අනුව උක්ත උපාධි පාඨමාලාවේ පළමු සමාසිකයේ විභාග සඳහා ලියාපදිංචි වූ සිසුන් 14 දෙනෙකුට අධ්‍යයන කටයුතු සිදු කරන ලද අතර සිසුන් 09 දෙනෙකු එම සාමාසිකය සාර්ථකව අවසන් කරන ලදී.

මෙයට අමතරව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය හා ශ්‍රී ලංකා ගිණුම් කරණ ශිල්පීය ආයතනය මගින් පවත්වනු ලබන විභාග සඳහා සිසුන් පුහුණු කිරීම සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. එමගින් සිසුන් 50ක් එම ආයතනවල පළමු විභාග සඳහා පහත පරිදි සුදානම් කරන ලදී.

පාඨමාලාවේ නම	ශිෂ්‍ය සංඛ්‍යාව
1. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහතික පත්‍ර 1 විභාගය	16
2. ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ තාක්ෂණික අදියර 1 (CMA)	24
3. ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ පදනම් අදියර	10
එකතුව	**50**

2011 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන්

කාර්යසාධන තරගාවලිය

ශ්‍රී ලාංකීය සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධිය උදෙසා විවිධ වූ සමුපකාර සංවිධානවල කාර්යසාධන ප්‍රගතිය නිර්ණය කිරීමේ ජාතික තරඟාවලියක් ප්‍රථමවරට 2007/2008 යන වර්ෂ පදනම් කරගෙන පවත්වනු ලැබීය.

එම තරගාවලිය සඳහා මෙරට ක්‍රියාත්මක සමුපකාර සංවිධාන

- විවිධ සේවා සමුපකාර සමිති
- මූල්‍ය සේවා සමුපකාර සමිති
- සේවා සමුපකාර සමිති
- නිෂ්පාදන සමුපකාර සමිති
- කෘෂිකර්ම හා සත්ව නිෂ්පාදන සමුපකාර සමිති
- පාසල් සමුපකාර සමිති

යන කාණ්ඩ යටතේ හඳුන්වා දී ඒ ඒ කාණ්ඩ යටතේ තරගාවලිය පවත්වා ජයග්‍රාහී සමුපකාර සංවිධානවලට රන්, රිදී, ලෝකඩ වශයෙන් කුසලාන හා සහතිකපත් ප්‍රදානය 2009 වර්ෂයේදී සිදු කරන ලදී.

ප්‍රථමවරට පැවති මෙම තරගාවලියේ කටයුතු අවසන් වී වසරක් පමණ කාලයක් ඉකුත් වූ පසු ලාංකීය සමුපකාර ව්‍යාපාරයේ නිලධාරීන්, නායකයින්, සේවකයින්, සාමාජිකයින් හා විවිධ සමුපකාර සංවිධානවලින් කළ ඉල්ලීම අනුව දෙවන වරටත් ශ්‍රී ලංකාවේ සමුපකාර සංවිධාන සම්බන්ධයෙන් මෙම තරගාවලිය 2010 දියත් කරන ලද අතර එය සංවිධාන මට්ටම් 3ක් යටතේ සිදු කරන ලදී. එනම්,

1. ප්‍රාථමික මට්ටමේ සමුපකාර සංවිධාන

I. විවිධසේවා සමුපකාර සමිති ක්ෂේත්‍රය
II. මූල්‍ය සේවා සමුපකාර සමිති ක්ෂේත්‍රය
III. නිෂ්පාදන හා කර්මාන්ත සමුපකාර සමිති ක්ෂේත්‍රය
IV. කෘෂි කර්මාන්ත සමුපකාර සමිති ක්ෂේත්‍රය
V. සේවා සමුපකාර සමිති ක්ෂේත්‍රය
VI. පාසල් සමුපකාර සමිති ක්ෂේත්‍රය

2. ද්විතීයික මට්ටමේ සමුපකාර සංවිධාන

I. දිස්ත්‍රික් හා පළාත්බද මූල්‍ය සේවා සංගම්
II. දිස්ත්‍රික් හා පළාත්බද වෙනත් සමුපකාර සංගම්

3. මධ්‍යම රජය යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංවිධාන

තරගාවලියේ සංවිධානය

1. මෙම තරගාවලිය මෙහෙයවීමේදී පළාත් විනිශ්චය කටයුත සම්බන්ධිකරණය සඳහා පළාත් මට්ටමේ සම්බන්ධිකරණ නිලධාරියෙකු බැගින් පත් කර එම නිලධාරින් පුහුණු කිරීම.

2. තරගාවලිය සඳහා අයඳුම්පත් එවූ සියළුම සමුපකාර සංවිධාන පළාත් මට්ටමේ දැනුවත් කිරීම් සහ එම ආයතනවල ප්‍රධානීන් කැඳවා නිර්ණායක පිළිබඳව දැනුවත් කිරීම.

3. මෙම තරගාවලියේ ඇගයීම් කටයුතු මට්ටම් 03ක් යටතේ විනිශ්චය කටයුතු සිදුකර ඇත.

   (අ) පළාත්බදව තෝරා ගන්නා ලද විනිශ්චය මණ්ඩලයක් මඟින් ප්‍රාථමික මට්ටමේ සමිති විනිශ්චය කිරීම.

   (ආ) ජාතික මට්ටමේ තෝරා ගන්නා ලද විනිශ්චය මණ්ඩලයන් මඟින් ද්විතීය හා මුදුන් මට්ටමේ සමුපකාර සමිති විනිශ්චය කිරීම.

   (ඇ) ජාතික වශයෙන් තෝරා ගත් මූලික කමිටුවක් මඟින් අවශ්‍ය පරිදි නැවත විනිශ්චය කිරීම

මෙම කාර්යසාධන තරගාවලියෙහි ජාතික මට්ටමේ කමිටුව පහත සඳහන් නියෝජිතයන්ගෙන් සමන්විත විය.

I. සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙනුවෙන් නියෝජිතයෙක්
II. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් (මධ්‍යම රජය)
III. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
IV. මධ්‍යම පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්
V. ශ්‍රී ලංකා සමුපකාර මණ්ඩලයේ නියෝජිතයෙක්

දෙවන වරට 2010 වර්ෂයේ පැවැත්වූ කාර්යසාධන තරගාවලියෙහි ජයග්‍රාහි සමුපකාර සංවිධානවලට තිළිණ ප්‍රදානය කිරීම 2011.06.28 වන දින සිට 2011.07.02 දින දක්වා කුරුණෑගල වෙලගෙදර ක්‍රීඩාංගනයේදී පැවති ජාත්‍යන්තර සමුපකාර දිනය සැමරීමේ ජාතික උත්සවයේදී අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් සිදු කරනු ලැබිය.

එම තරගාවලියේ ජයග්‍රාහී සමුපකාර සංවිධාන සඳහා රන්, රිදී සහ ලෝකඩ කුසලාන ශ්‍රී ලංකාවේ අතිගරු ජානාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සව මාලාවේ දී ප්‍රදානය කර ඇත. සම්මාන පිරිනමා ඇති ආකාරය පහත සඳහන් වේ.

1. රන් සම්මාන	27
2. රිදී සම්මාන	138
3. ලෝකඩ සම්මාන	77
එකතුව	**242**

මේ හැර ඉහළම ලකුණු ලබාගත් සමුපකාර සංවිධාන සියය (Top Hundred) සඳහා කුසලතා සහතික සියයක් ද පිරිනමන ලදී.

යෝජිත තරගාවලිය ලාංකීය සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධිය සඳහා වූ කාර්යසාධනය වර්ධනය කරලීම සඳහා මහත් වූ රුකුලක් මෙන්ම මග පෙන්වීමක් සිදු කර ඒ අනුව සමුපකාර සංවිධාන කාර්යක්ෂමතාවයේ උත්තේජනයට යොමු කර වීමට සමත්වී ඇති බැව් සඳහන් කළ හැකි අතර එය මෙරට සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධියට රුකුලක් වී ඇති බවද සඳහන් කළ හැක.

මෙම තරගාවලිය පැවැත්වීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පාදනය මහා භාණ්ඩාගාරයේ වාර්ෂික ප්‍රතිපාදන මගින් හා මහජන බැංකුව මගින් ලබා දී ඇත. 2011.05.31 දිනදී මහජන බැංකුව විසින් ලබාදී ඇති මුදල රු.2,732,250/=කි. ජාතික මට්ටමේ අනෙකුත් ව්‍යාපාර සමඟ තරඟකාරිත්වයට මුහුණදීම සඳහා සමුපකාර අභිවෘද්ධිය උදෙසා කාර්යසාධන තරඟාවලියට මහජන බැංකුව මෙලෙස දායක වී ඇති අතර, 2009 වර්ෂයේදීද සමුපකාර අරමුදලින් දායකත්වය ලබාදී ඇත.

මෙම තරගාවලි සඳහා දරා ඇති මුළු වියදම පහත පරිදි වේ.

2010 වර්ෂයේ වියදම	-	2,618,465.02
2011 වර්ෂයේ වියදම	-	2,515,945.19
මුළු වියදම	**-**	**5,134,410.21**

දේශීය විදේශීය සමුපකාර සංවිධාන සමඟ සම්බන්ධතා ජාලයක් ගොඩනඟා ගැනීම.

ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් වැදගත් ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත්කර ගැනීමත් ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධතා ජාලය ශක්තිමත් කර ගැනීමත් මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි ප්‍රධාන ඉලක්කයක් ලෙස හඳුනාගෙන ඇති අතර, ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරය පෝෂණයවීම සඳහා විශේෂයෙන් දැනුම හා කුසලතා හුවමාරු කර ගැනීමේ අභිලාශයෙන් ජාත්‍යන්තර සමුපකාර සංවිධාන සමඟ සම්බන්ධතා ජාලයක් ඇති කර ගැනීමට කටයුතු කරනු ලැබිණ.

සමාලෝචිත වසර තුලදී ඉන්දියාවේ වෛකුන්මේතා ජාතික සමුපකාර කළමනාකරණ ආයතනය සමඟ ඇති කරගෙන ඇති ගිවිසුම යටතේ ශ්‍රී ලංකීය සමුපකාර ක්ෂේත්‍රයේ නිලධාරීන්ට හා සේවකයින්ට ඉන්දියාවේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳ දැනුම හා අවබෝධය ලබාදීම අරමුණු කරගෙන දින 5ක කෙටිකාලීන පුහුණු වැඩමුළුවකට 24 දෙනෙකු සහභාගි කරවනු ලැබිණි.

අන්තර් ජාතික සමුපකාර ක්ෂේත්‍රය හා ඇති සබඳතා හා ක්‍රියාකාරකම්.

ඉන්දියාවේ Center for International Co-operation and Training in Agriculteral Banking (CICTAB) ආයතනයේ අප ආයතනය සාමාජිකත්වය ලබා ඇත. CICTAB මගින් අප ආයතනය වෙත පිරිනමන ලද ශිෂ්‍යත්ව සඳහා නිලධාරීන් 5 දෙනකු සහභාගිවී ඇත. විස්තර පහතින් දක්වා ඇත.

1. Programme on skill development of training in the area of promotion and financing of self-help groups and joint liability groups for financial inclusion of rural poor, නැමැති වැඩසටහනට පෙබරවාරි 21-24 දක්වා ඉන්දියාවේ ලක්නව් හිදී පැවති අතර මේ සඳහා අප ආයතනයේ සහකාර කථිකාචාර්ය කේ. එච්. ඒ. නන්දන බණ්ඩාර මයා සහභාගි විය.

2. Programme on Training Techniques for Trainers of Co-operatives and rural financing institiutions නැමති වැඩසටහන මාර්තු 14-18 දක්වා නේපාලයේ කත්මන්ඩු නුවරදී පැවැත්වූ අතර මේ සඳහා අප ආයතනයේ සහකාර කථිකාචාරිණි නාමලී නනායක්කර මිය සහභාගි විය.

3. Fifteenth meeting of the General Council of CICTAB - මෙම රැස්වීම ජුනි 10 වන දින ඉන්දියාවේ නවදිල්ලි නුවරදී පැවති අතර මේ සඳහා අප ආයතනයේ සභාපති ලක්මාල් රත්නායක මහතා සහභාගි විය.

4. Trainers Training Programme on restructring and strengthing Agricultural /Rural financing institutions – මෙම වැඩසටහන ජුලි 18-22 දක්වා ඉන්දියාවේ පූනේහිදී පැවැත්වුණු අතර මේ සඳහා අප ආයතනයේ සහකාර කථිකාචාරිනි ශානිකා මුදන්නායක මිය සහභාගි විය.

5. Programme on application of information technology for development of Agricltural Co-operatives and rural financing institutions - මෙම වැඩසටහන දෙසැම්බර් 19-23 දක්වා ඉන්දියාවේ පූනේ හිදි පැවැත්වුණු අතර, අප ආයතනයේ පරිගණක උපදේශිකා රිෂාන්ති වික්‍රමසිංහ මහත්මිය මෙයට සහභාගි විය.

අන්තර් ජාතික සමුපකාර සන්ධානය (ICA) හි අප ආයතනය සාමාජිකත්වය ලබා ඇති අතර එහි පහත රැස්වීම් සඳහා සහභාගිවී ඇත.

අප ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ඩබ්. ඒ. ආර්. විමලසිරි මහතා මලයාසියාවේ ක්වාලාලාම්පූර් නගරයේදී ජුලි 4-6 වන දින දක්වා පැවැත්වූ 23rd Meeting of HRD Committee and regional Seminar on need and importance of HRD in Co-operative with special reference of training of Board of Directors සහභාගිවිය.

අප ආයතන සභාපති ලක්මාල් රත්නායක මහතා මක්සිකෝහි කැන්කුන් හි පැවති ICA Genaral Essambly and related meetings සඳහා සහභාගි විය.

ආයතනයේ අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායකත්වය සපයන අංශ, එහි ක්‍රියාකාරකම් හා පහසුකම්

නේවාසික අංශය

ආයතනයේ පුහුණුව සඳහා පැමිණෙන පුහුණුවන්නන්ගේ නවාතැන් අවශ්‍යතා අනුව සියලු නේවාසිකයින් සඳහා ඉගෙනගැනීමට සුදුසු පරිසරයක් හා ආරක්ෂා සහිතව නැවතීමේ පහසුකම් සැපයීම නේවාසික අංශයේ ප්‍රධාන කාර්ය වේ.

මහල් දෙකකින් යුක්ත නේවාසිකාගාර 5කින් ද මහල් 3කින් යුත් නේවාසිකාගාරයක් සමඟ නේවාසිකාගාර 7කින් නේවාසික අංශය සමන්විත වන අතර, එහි 252 දෙනෙකුට එකවර නවාතැන් පහසුකම් ලබා ගැනීමේ හැකියාව ඇත.

පොදු නේවාසිකාගාර

වායු සමනය කළ විශේෂිත කාමර

නේවාසිකාගාරය	කාමර සංඛ්‍යාව	පහසුකම් සැපයිය හැකි නේවාසිකයින් සංඛ්‍යාව
1. D නේවාසිකාගාරය	20	40
2. E නේවාසිකාගාරය	20	40
3. F නේවාසිකාගාරය	20	40
4. G නේවාසිකාගාරය	20	40
5. H නේවාසිකාගාරය	06	18
6. ඒ. රත්නායක නේවාසිකාගාරය (වායු සමනය කර ඇත.)	14	26
7. නව රත්නායක නේවාසිකාගාරය (වායු සමනය කර ඇත.)	22	26
8. RH නිවාස 02	06	12
9. නිවාඩු නිකේතනය	04	10
එකතුව	**132**	**252**

නේවාසික අංශය මගින් පාලනය වන භෝජනාගාරය මඟින් නේවාසිකයින්ට අවශ්‍ය වන ආකාරයට ආහාර පාන සැපයීම සිදු කරනු ලබන අතර දිනකට ආයතනයේ පුහුණුවීම් කටයුතුවල නියැලෙන 100ත් 300ත් අතර පුහුණුලාභීන් ප්‍රමාණයකට ආහාර සැපයීම සිදු කරනු ලබයි.

පුස්තකාල අංශය

මෙහි පාඨක ප්‍රජාව වනුයේ කථිකාචාර්ය මණ්ඩලය, පුහුණුලාභීන්, සහ ආයතනයේ අනෙකුත් කාර්ය මණ්ඩලය වේ.

2011 වර්ෂයේදී පරිග්‍රහණය පොත් සංඛ්‍යාව 112ක් වන අතර දැනට පුස්තකාලයේ ඇති මුළු පොත් සංඛ්‍යාව 21284 කි. මෙහි පොත් එකතුව සමුපකාර විෂය, කළමනාකරණ, ගණකාධිකරණ, සමාජ විද්‍යා, පරිගණක හා අනෙකුත් අතුරු විෂයන් ගෙන් සමන්විත වේ. තොරතුරු ගවේශණය සඳහා අන්තර්ජාල පහසුකම් ද පුස්තකාලයේ ඇත. තවද පුස්තකාලය විසින් පාඨකයන් වෙනුවෙන් සමුපකාර ක්ෂේත්‍රයට සම්බන්ධ තොරතුරු එකතුවක්, පුවත්පත් ලිපි අනුක්‍රමණිකාවක් පවත්වාගෙන යනු ලබයි.

පුස්තකාලය බැහැර දෙන අංශය මෙන්ම විමර්ශන අශයකින්ද සමන්විත වේ.

විභාග අංශය

ආයතනය මගින් පවත්වනු ලබන නිත්‍ය පුහුණු පාඨමාලා වන සමුපකාර පරීක්ෂකවරුන්ගේ සහතික පත්‍ර පාඨමාලාව, ඩිප්ලෝමා පාඨමාලාව ඇතුළුව සමුපකාර වෘත්තිකයින් සඳහා වූ ඩිප්ලෝමා පාඨමාලා සහ සහතික පත්‍ර පාඨමාලා සඳහා විධිමත් විභාග පටිපාටියක් යටතේ සියලු විභාග පවත්වනු ලබන්නේ විභාග අංශය මගිනි. සියලුම විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන මණ්ඩලයේ හා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය යටතේ සිදුකෙරේ.

ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය

පුහුණු වැඩසටහන්වලදී අවශ්‍ය වන ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක සැපයීම ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය මගින් සිදු කරනු ලබයි. වීඩියෝ චිත්‍රපට ප්‍රදර්ශන යන්ත්‍ර, ශීර්ෂ ප්‍රක්ෂේපන යන්ත්‍ර, ශබ්දවාහිනී යන්ත්‍ර පුහුණු වැඩසටහන් සඳහා ලබාදීම මෙන්ම ආයතනය විසින් සිදු කරනු ලබන විවිධ වැඩසටහන් ඡායාරූප ගත කිරීම හා වීඩියෝ ගත කිරීමත් මෙම අංශයෙන් සිදු කරනු ලබන තවත් සේවාවකි.

අධ්‍යයන හා පුහුණු අංශය

ආයතනයේ ප්‍රමුඛ පරමාර්ථය වන්නේ සමුපකාර ක්ෂේත්‍රයේ අධ්‍යාපනය හා පුහුණුව ලබාදීමයි. මෙම පරමාර්ථය ප්‍රමුඛ කරගෙන ආයතනයේ අධ්‍යයන හා සංවර්ධන අංශය පහත සඳහන් පරිදි උප අංශ කිහිපයකින් සමන්විත වේ.

1. සමුපකාර සංවර්ධන අංශය
2. මානව සම්පත් සංවර්ධන අංශය
3. පර්යේෂණ හා පුහුණු අංශය
4. මුල්‍ය කළමනාකරණ හා සංවර්ධන අංශය
5. ව්‍යාපාර කළමනාකරණ සංවර්ධන අංශය
6. උපදේශක සේවා අංශය
7. තොරතුරු තාක්ෂණ අංශය

ඉහත එක් එක් අංශ, කථිකාචාර්යවරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර මෙම ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුළත් කථිකාචාර්ය මහත්ම මහත්මීන් 07 දෙනෙකු සිටින අතර මෙයට අමතරව විවිධ විෂයයන් සඳහා ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් බාහිර සම්පත්දායක සංචිතයක් ද ඇතිකර තිබේ. ආයතනයේ

කථිකාචාර්ය මණ්ඩලයේ හා බාහිර සම්පත්දායකයින්ගේ සේවය ලබා ගනිමින් ආයතනය ක්‍රියාත්මක කරනු ලබන සියලුම පාඨමාලාවල ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරිමට කටයුතු කර තිබේ.

අධ්‍යයන කටයුතු සිදු කිරීම නවීන ශ්‍රව්‍ය දෘෂ්‍ය පහසුකම්වලින් සමන්විත දේශන ශාලා 11කට වැඩි ප්‍රමාණයක් ආයතනය සතු වන අතර ඒවායේ මුළු ධාරිතාවය ආසන 1245කි. විස්තර පහත පරිදි වේ.

අනු අංකය	ශාලාව	ආසන සංඛ්‍යාව
1.	වින්සන්ට් සුභසිංහ ශාලාව	600
2.	රත්නායක ශාලාව	55
3.	රොච්ඩෙල් ශාලාව	100
4.	නව රොච්ඩේල් ශාලාව	80
5.	B ශාලාව	100
6.	C^1 ශාලාව	35
7.	C^2 ශාලාව	20
	බහුකාර්ය ගොඩනැගිල්ල	
8.	දේශන ශාලා අංක - 01	45
9.	දේශන ශාලා අංක - 02	80
10.	දේශන ශාලා අංක - 03	50
11.	Mini Conference Hall	80
	එකතුව	**1245**

එයට අමතරව පරිගණක 96කින් සමන්විත පරිගණක විද්‍යාගාර 5ක් ආයතනය සතුව පවතින අතර, එහි විස්තර පහත පරිදි වේ.

අනු අංකය	විස්තරය	පරිගණක සංඛ්‍යාව
1.	මුද්‍රණාල ගොඩනැගිල්ලෙහි ඉහල මහලයේ පිහිටි ප්‍රධාන පරිගණක විද්‍යාගාරය	30
2.	බහුකාර්ය ගොඩනැගිල්ලෙහි පිහිටි පරිගණක විද්‍යාගාර අංක 1 පරිගණක විද්‍යාගාර අංක 2 පරිගණක විද්‍යාගාර අංක 3	 20 24 22
	එකතුව	96

මුද්‍රණාල අංශය

ආයතනයේ සියලුම පාඨමාලා සඳහා අවශ්‍ය කරන නිබන්ධන හා සටහන් මුද්‍රණය කිරීම හා පොත් සඟරා මෙන්ම බාහිර ආයතන මගින් කෙරෙන ඉල්ලීම මත මුද්‍රණ කටයුතු කිරීම මුද්‍රණාල අංශය මගින් කෙරෙන අතර මධ්‍යම මට්ටමේ මුද්‍රණාලයකට අවශ්‍ය කෙරෙන මුද්‍රණාල උපකරණවලින් සමන්විත අංගසම්පූර්ණ මුද්‍රණාලයක් ආයතනය සතුව පවතී.

මුද්‍රණාලය

භෞතික සම්පත් හා භෞතික සම්පත් සංවර්ධනය

භෞතික සම්පත් සංවර්ධනය සඳහා 2011 වසර තුල **රුපියල් මිලියන 8.3ක මුදලක්** යෙදවූ අතර එහි විස්තර පහත පරිදි වේ.

විස්තරය	භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින්	ආයතනයේ ඉපයීම් මගින්
1. ශ්‍රවනාගාර ගොඩනැගිල්ල ඉතිරි ඉදිකිරීම	5,367,136.00	-
2. බහුකාර්ය ගොඩනැගිල්ලෙහි අත්වාරු වැටක් ඉදිකිරීම	46,500.00	-
3. ලී බඩු කාර්යාල උපකරණ හා පරිගණක හා උපාංග මිලදී ගැනීම	725,955.95	1,891,968.80
4. ක්‍රීඩා පිටියේ බැම්ම වැඩි දියුණු කිරීම	-	76,442.70
5. ආයතන භූමිය අලංකරණය කිරීම	-	221,660.00
එකතුව	**6,139,591.95**	**2,190,071.50**



ඩබ්. ඒ. ආර්. විමලසිරි
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

	සටහන්	2010.12.31 දිනට රු.	2011.12.31 දිනට රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	2	436,370,603	433,831, 937
දිගුකාලීන ණය ගැතියන්, ආයෝජන හා තැන්පතු	3	645,000	645,000
		437,015,603	434,476,937
ට්‍රාන්ස්ෆෝමරය මත විලම්බිත අය භාර වියදම්		3,361,880	4,037,640
අඩුකලා : ආදායමට එරෙහිව විලම්භිත අය භාර වියදම් ලිහාහැරීම		(84,945)	(320,085)
ට්‍රාන්ස්ෆෝමරය මත විලම්භිත අය භාර වියදම් ඉතිරි ශේෂය		3,276,935	3,717,555
ජංගම වත්කම්			
කෙටිකාලීන තැන්පතු	4	7,200,000	8,400,000
තැන්පතු සහ ණය ගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂය	5	34,306,691	33,108,177
තොග	6	746,517	1,107,482
බැංකුවේ ඇති මුදල්	7	36,431,417	34,495,244
		78,684,625	**77,110,903**
මුළු වත්කම්		**518,977,162**	**515,305,394**
හිමිකම් සහ වගකීම්			
ප්‍රග්ධනය හා සංචිත			
ප්‍රග්ධනය	8	233,254,215	233,254,215
සමුච්චිත ලාභය/(අලාභය)	9	(71,645,446)	(82,212,917)
		161,608,769	**151,041,298**
සංචිත			
භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	10	331,878,075	333,878,075
අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	11	3,391,392	2,841,392
ප්‍රකාශන අරමුදල		3,417,039	3,417,039
		338,686,506	**340,136,506**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		1,651,612	1,987,359
රැඳවුම් මුදල්		9,030,744	9,990,811
		10,682,356	**11,978,170**
ජංගම වගකීම්			
ණය හිමියන් සහ උපචිත වියදම්	12	7,999,531	12,149,420
බැංකු අයිරා		-	-
		7,999,531	**12,149,420**
මුළු හිමිකම් සහ වගකම්		**518,977,162**	**515,305,394**

ඒ. එම්. ඒ. ඒ. එල්. රත්නායක
සභාපති

ඩබ්. ඒ. ආර්. විමලසිරි
අධ්‍යක්ෂ ජනරාල්

කේ. ඩී. අනිල්
ජ්‍යේෂ්ඨ කළමනාකරු (මූල්‍ය)

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
ආදායම් වියදම් ගිණුම

	සටහන්	සත්‍ය 2010	සත්‍ය 2011
ආදායම්		රු.	රු.
පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදාන	**13**	22,390,000	22,743,582
අනෙකුත් ආදායම්	**14**	20,644,631	21,420,631
		43,034,631	**44,164,213**
අඩුකලා : වියදම්			
01. වැටුප් හා වේතන	**15**	19,512,564	20,323,326
02. ගමන් වියදම්	**16**	753,427	1,503,396
03. සැපයුම්	**17**	3,902,331	4,020,912
04. නඩත්තු වියදම්	**18**	2,405,953	3,125,426
05. ගිවිසුම් ගත සේවා	**19**	9,206,898	12,751,894
06. වෙනත්	**20**	4,255,583	1,162,696
07. ක්ෂය කිරීම්	**21**	10,213,688	10,869,316
08. විලම්භිත වියදම් ලියාහැරීම		84,945	320,085
		50,335,390	**54,077,051**
අසාමාන්‍ය අයිතම්වලට පෙර ආදායම ඉක්මවු අතිරික්තය/(ඌනය)		**(7,300,759)**	**(9,912,838)**
අසාමාන්‍ය අයිතමයන් (ශුද්ධ ලාභය හෝ අලාභය)		-	-
බද්දට පෙර ආදායම ඉක්මවා ඇති අතිරික්තය හෝ (ඌනය)		**(7,300,759)**	**(9,912,838)**
අඩු කලා බදු සඳහා වෙන් කිරීම්		-	
ශුද්ධ අතිරික්තය/(ඌනය)		**(7,300,759)**	**(9,912,838)**

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

බදුවලට පෙර ආදායම් ඉක්මවූ වියදම්		**(9,912,838)**
ගැළපීම්		
ක්ෂවීම්	10,869,316	
විලම්භිත වියදම් ක්‍රමක්ෂය	320,085	
ගිවිසුම් අත්තිකාරම්	(5,000)	
ගිවිසුම් අත්තිකාරම්	643	
ස්ථාවර වත්කම් විකුණුම් ලාභ	(1,060,830)	
බොල් ණය වෙන් කිරීම	(283,589)	
අළුත්වැඩියා හා නඩත්තු - රැඳවුම් මුදල්	86,238	
පාරිතෝෂික සඳහා වෙන්කිරීම	520,418	
පාරිතෝෂික ගෙවීම්	(184,671)	
පොලී ගෙවීම්	-	-
පොලී ආදායම	-	10,262,610
කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් ලාභය/පාඩුව	-	**349,772**
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම		
ණයගැති අඩුවීම් (වැඩිවීම්)	(825,037)	
යෙදවුම් බදු වැඩිවීම්	1,238,288	
උපචිත වියදම් සහ ණයහිමි වැඩිවීම් (අඩුවීම්)	4,149,889	
තොග අඩුවිම් හා (වැඩිවීම්)	(360,965)	4,202,175
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල් ගලායෑම්		**4,551,947**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ගලායෑම්		
රඳවාගත් මුදල්	(89,487)	
දේපල, යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම් (Vat-2,748)	(398,147)	
- ඉඩම් සංවර්ධනය	(258,576)	
- ලී බඩු සහ උපකරණ (Vat – 123,190.77)	(1,363,531)	
- පුස්තකාල පොත්	(74,826)	
- වෙනත් උපකරණ (Vat – 5,055.20)	(52,875)	
කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධන ආයෝජන (Vat – 559.776)	(5,413,636)	
වීලම්භිත වියදම් ක්‍රමක්ෂය	(705,419)	
දිගුකාලීන ආයෝජන	(1,200,000)	
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල	1,060,830	
පොලි ආදායම		
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ගලායෑම්		**(8,495,667)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ගලායෑම්		
භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන දීමනා	2,000,000	
සමුපකාර අරමුදලෙන් ලද දීමනා- මහජන බැංකුව	-	
බැංකු ණය ගෙවීම් - මහජන බැංකුව	-	
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ගලා යෑම		**2,000,000**
වර්ෂය තුළ ශුද්ධ මුදල් ගලායෑම් වැඩිවීම්		**(1,943,720)**
කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ		36,431,417
කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ		34,495,244

වෙනස්වීම් ප්‍රකාශය

	CAPITAL	PROFIT/(LOSS)	CAPITAL RESERVE	GENERAL RESERVE	TOTAL
2010.01.01 දිනට ශේෂය	**233,254,215**	**(63,793,304)**	**265,619,467**	**-**	**435,080,378**
කාලපරිච්ඡේදය සඳහා ලාභ/පාඩු	**-**	(7,300,759)	-	-	(7,300,759)
පෙර වර්ෂය ගැළපීම්	**-**	(551,383)	-	-	(551,383)
කාලපරිච්ඡේදය තුළ ආයෝජන	**-**	-	73,617,039	-	73,617,039
කාලපරිච්ඡේදය තුළ ආයෝජන			(550,000)	-	(550,000)
2010.12.31 දිනට ශේෂය	233,254,215	**(71,645,446)**	**338,686,506**	**-**	**500,295,275**
2011.01.01 දිනට ශේෂය	**233,254,215**	**(71,645,446)**	**338,686,506**	**-**	**500,295,275**
කාලපරිච්ඡේදය තුළ ගැළපීම්	-	(662,181)	-	-	**(662,181)**
කාලපරිච්ඡේදය තුළ ආයෝජන	-	-	2,000,000	-	**2,000,000**
අඩුකිරීම් : ක්ෂය	-	-	(550,000)	-	**(550,000)**
වර්ෂය තුළ ලාභ/පාඩු	-	(9,912,838)	-	-	**(9,912,838)**
2011.12.31 දිනට ශේෂය	**233,254,215**	**(82,212,917)**	**340,136,506**	**-**	**491,177,804**

2011.12.31 දිනට ගිණුම්වල අදාල සටහන්

සටහන : 01

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 අ. ගිණුම්කරණ සම්ප්‍රදායයන්

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්වලට සටහන් වලින් සමන්විත වේ. ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කොට ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රමිතීන් ඒකීයව යොදවනු ලැබේ.

1.1 ආ. ගිණුම් ආකෘති

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ගිණුම් ආකෘතීන්ට අනුකූලව පිළියෙල කොට ඇත. වර්තමාන වර්ෂය සමඟ ඒකීය වන අයුරින් පෙර වර්ෂවල වාර්තා අගයන් සහ ප්‍රකාශනයන් යළි සකස් කොට ඇත.

1.1 ඇ. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍රදිනට පසු සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට භාජනය කර ඇති අතර, අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කිරීම් සහ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

1.2 වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

1.2 අ. දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගත් පිරිවැය හෝ ඉදිකිරීමට වැය කරන ලද අගය සමඟ ඒවායේ පිරිවැය හා අදාල කරගත හැකි අනෙකුත් වියදම් සමඟ ඉදිරිපත් කොට ඇත. දේපල, පිරියත සහ උපකරණ ගිණුම්ගත කොට ඇත්තේ පිරිවැය හෝ ප්‍රති අගය කරන ලද වටිනාකමෙන්, පහත සඳහන් අනුපාතයන්ට අනුව කරන ලද සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසුවයි.

1.2 ආ. ක්ෂය කිරීම

වත්කම්වල පිරිවැය, ඒවායෙහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා සමාන වාර්ෂික වාරික වලින් ලියා හැරීම පදනම් කොට ගෙන පහත සඳහන් පරිදි ක්ෂයවීම් සඳහා වෙන් කිරීම් ගණනය කොට ඇත.

වත්කම	ඵලදායි ජීවිත කාලය
ගොඩනැගිලි	වර්ෂ 40
මෝටර් රථ වාහන	වර්ෂ 04
ලීබඩු සහ උපකරණ	වර්ෂ 10
පොත් සහ සඟරා	වර්ෂ 04
යන්ත්‍ර සූත්‍ර	වර්ෂ 05
තිර රෙදි හා අනෙකුත් දෑ	වර්ෂ 03

වත්කම් මිලදී ගත් වර්ෂයේ කාල පදනම මත මිළදී ගත් වර්ෂයට ක්ෂය කරනු ලැබේ. විදුලි ට්‍රාස්ෆෝමර් දෙක සඳහා දැරූ වියදම විලම්භිත කර ක්‍රමක්ෂය ලෙස වසර 40ක කාලයක් තුළ ලිහා හරිනු ලැබේ. තිරරෙදි සපයා සවි කිරීම හා මෙට්ට හා අනෙකුත් රෙදි සඳහා දැරූ වියදම් ද විලම්භිත කර වර්ෂ 3ක කාලයක් තුල ලිහා හරිනු ලැබේ.

1.3 වගකීම් සහ වෙන් කිරීම්

1.3 අ. පාරිතෝෂික සඳහා වෙන් කිරීම්

ශේෂ පත්‍ර දිනට වර්ෂයක සේවා කාලයක් ඉක්මවා ඇති සේවා දායකයින් සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත අනුව විශ්‍රාම ගැන්වීමේ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සේවාදායකයින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට හිමිකම් කියනු ලබයි. ආයතනය විසින් පිළිවෙලින් 15% සහ 3% වශයෙන් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවාදායකයන්ගේ මූලික වැටුප මත දායක වනු ඇත.

1.3 ආ. බොල් ණය සඳහා ප්‍රතිපාදන

බොල් ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර නැත.

1.3 ඇ. අනෙකුත් වගකීම්

මූල්‍ය ප්‍රකාශනවල සේවාදායකයන්ගේ සහ වෙනත් පාර්ශවයන්ගේ නෛතික ක්‍රියාමාර්ග නිසා ඇතිවිය හැකි අසම්භාව්‍යයන් සඳහා ප්‍රතිපාදන වෙන්කර නොමැත.

1.4 ආදායම් හා වියදම් ගිණුම

1.4 අ. ආදායම් හඳුනාගැනීම

- සපයන ලද සේවා සඳහා ගාස්තු උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.
- ඩිප්ලෝමා පාඨමාලා සහ අනෙකුත් සහතික පත්‍ර පාඨමාලා ගාස්තු උපචිත සංකල්පයට අනුව සේවා සැපයූ පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.

1.4 ආ. වියදම්

සියළු වියදම් උපචිත සංකල්පයට අනුව ගිණුම්ගත කරනු ලැබේ.

1.5 රජයේ ප්‍රතිපාදන

1.5 අ. ප්‍රාග්ධන ප්‍රතිපාදන

ප්‍රාග්ධන ස්වරූපයෙන් ලබන රජයේ ප්‍රතිපාදන වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ සංචිත ලෙස හඳුනා ගනු ලබයි.

1.5 ආ. පුනරාවර්තන ප්‍රතිපාදන

ප්‍රතිපාදන ලැබූ වර්ෂයේ ආදායම් ලෙස ආදායම් සහ වියදම් ගිණුමේ ගිණුම්ගත කරනු ලැබේ.

පුහුණු වැඩසටහන් සඳහා මහජන බැංකුවේ සමුපකාර අරමුදලෙන් රු.800,000/=ක් ප්‍රදාන ලෙස 2011 වර්ෂයේදී ලැබුණි. එයින් රු.234,163.40ක් වියදම් කර පුහුණු වැඩසටහන් 03ක් එම වර්ෂයේදී පවත්වා, එම මුදල කෙටිකාලීන පාඨමාලා ආදායම් යටතේ පෙන්වා ඇත. ඉතිරි උපයෝජනය නොකළ ප්‍රදාන රු.565,836.60ක මුදල කලින් ලද පාඨමාලා ගාස්තු යටතේ පෙන්වනු ලැබීය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ආයතනයේ කළමනාකාරිත්වයේ වගකීමකි.

1.7 2011.12.31 දින ගබඩාවේ හා මුද්‍රණාල අංශයේ ලිපි ද්‍රව්‍ය අනෙකුත් කාර්යාල උපකරණ තොග මධ්‍යයන ක්‍රමයට අගය කොට ඇති අතර අලෙවිය සඳහා ඇති ප්‍රකාශන පිරිවැයට අගය කොට ඇත.

1.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට පිළියෙල කර ඇත.

1.9 ආයතනයේ හිටපු නිලධාරින් විසින් ආයතනයට එරෙහිව නඩු 02ක් ගොනු කර ඇති අතර, ඔවුන් පදිංචිව සිටි නිල නිවාස වලින් ඉවත් කිරීම සඳහා ආයතනය විසින් නීති මගින් කටයුතු කර ඇත.

1.10 2011 දෙසැම්බර් 31 දිනට ආයතනයේ සේවක මණ්ඩලය 36ක් විය.

1.11 2011.12.31 දින වන විට රුපියල් මිලියන 32.79ක් වටිනා ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇත. එයින් 70%ක් පමණ වත්කම් ප්‍රමාණයක් නැවත අගය නොකර වර්තමාන වර්ෂයේදී ප්‍රයෝජනයට ගනියි. සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල සාරාංශයක් පහත පරිදි වේ.

වත්කම් කාණ්ඩය	පිරිවැය රුපියල් මිලියන වලින්
(අ) යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	20.28
(ආ) පුස්තකාල පොත්	1.85
(ඇ) මෝටර් රථ වාහන	6.10
(ඈ) ලී බඩු හා සවිකිරීම්	3.79
(ඉ) අනෙකුත් උපකරණ	0.75
	32.79

1.12 ජාතික සමුපකාර සංවර්ධන ආයතනය විසින් මුද්‍රණය කර විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත සරසවි පොත් හල වෙත යවා ඇති පොත් වලින් රු. 6,000/=ක් වටිනා පොත් 12ක් 2011.12.31 දිනට නොවිකිණී තිබිණ. ඒවායෙහි පිරිවැය රුපියල් 2069.52 කි.

සටහන : 02

දේපල, පිරියත හා උපකරණ

පිරිවැය/ පුනඃ අගය	2011.01.01 දිනට ශේෂය	පෙර වර්ෂයේ ගැලපීම්		ගැලපීම්වලට පසු ශේෂය	වසර තුළ එකතු කිරීම්	ගැලපීම්	2011 සත්‍ය අගය රු.
		එකතු කිරීම්	අඩු කිරීම්				
ඉඩම්	134,261,243	142,343	-	134,403,586	303,973	-	134,707,559
ගොඩනැගිලි සහ ආකෘති	191,782,148	173,736	-	191,955,884	-	-	191,955,884
යන්ත්‍රසූත්‍ර හා උපකරණ	44,068,997	160,029	-	44,229,026	395,399	(1,213,303)	43,411,122
රථවාහන	6,273,331	-	(75,000)	6,198,331	-	(90,000)	6, 108,331
ගෘහ භාණ්ඩ	10,144,907	-	-	10,144,907	1,240,340	(55,640)	11,329,607
පුස්තකාල පොත්	2,032,875	-	-	2,032,875	74,826	-	2,107,701
තිරරෙදි සහ වෙනත්	3,572,126	16,675	(2,610,863)	977,938	47,820	-	1,025,758
එකතුව	**392,135,628**	**-**	**(2,685,863)**	**389,942,549**	**2,062,358**	**(1,358,943)**	**390,645,964**

සමුච්චනය කළ ක්ෂවීම්	2011.01.01 දිනට ශේෂය	පෙර වර්ෂයේ ගැලපීම්		ගැලපීම්වලට පසු ශේෂය	වසර තුළ එකතු කිරීම්	ගැලපීම්	2011 සත්‍ය අගය රු.
		එකතු කිරීම්	අඩු කිරීම්				
ගොඩනැගිලි සහ ආකෘති	32,030,672	12,431	(7,190)	32,035,914	4,798,897	313.43	36,835,124
යන්ත්‍රසූත්‍ර හා උපකරණ	30,432,094	590,607	-	31,022,702	4,572,917	(1,213,303)	34,382,316
රථවාහන	5,537,988	-	(75,000.00)	5,462,988	550,000	(90,000)	5,922,988
ගෘහ භාණ්ඩ	5,986,256	-	(5,550)	5,980,706	983,625	(55,640)	6,908,692
පුස්තකාල පොත්	1,902,282	-	-	1,902,282	64,697	-	1,966,979
තිරරෙදි සහ වෙනත්	2,989,530	88,244	(2,555,577)	522,196	449,180	-	971,376
එකතුව	**78,878,823**	**691,282**	**(2,643,317)**	**76,926,788**	**11,419,316**	**(1,358,630**	**86,987,475**
දළ පොත් අගය	**392,135,628**	**-**	**(2,685,863)**	**389,942,549**			**390,645,964**
සමුච්චනය කළ ක්ෂයවීම්	**78,878,823**		**(2,643,317)**	**76,926,788**			**86,987,475**
ශුද්ධ අගය	**313,256,805**		**(42,545)**	**313,015,761**			**303,658,489**

(ප්‍රාග්ධන) නොනිමි වැඩ	2011.01.01 දිනට ශේෂය	පෙර වර්ෂයේ ගැලපීම්		ගැලපීම්වලට පසු ශේෂය	වසර තුළ එකතු කිරීම්	ගැලපීම්	2011 සත්‍ය අගය රු.
		එකතු කිරීම්	අඩු කිරීම්				
2/2/6/20-ශ්‍රවනාගාරය	123,113,797	-	-	123,113,797	6,853,060	206,590	130,173,448
	123,113,797	**-**	**-**	**123,113,797**	**6,853,060**	**206,590**	**130,173,448**
ඉදිරියට ගෙන ගිය අගය	**436,370,602**		**(42,545)**	**436,129,558**			**433,831,937**

සටහන - 03	2010 රු.	2011 රු.
දිගු කාලීන ආයෝජන, ණය ගැතියන් හා තැන්පතු		
3203 විදුලිය සඳහා තැන්පතු	645,000	645,000
	645,000	645,000

සටහන - 04

	2010	2011
කෙටිකාලීන ආයෝජන		
3401 කෙටිකාලීන ආයෝජන	7,200,000	8,400,000
	7,200,000	**8,400,000**

සටහන - 05

	2010	2011
ණය ගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂ හා තැන්පතු		
3501-3512 අයවිය යුතු පාඨමාලා ගාස්තු (උප ලේඛන : 5A)	2,054,180	961,372
3504 අයවිය යුතු බාහිර වැඩසටහන් ගාස්තු	1,748,511	1,973,817
3513 අයවිය යුතු මුද්‍රණ සේවා ගාස්තු	151,096	96,097
වෙනත් තැන්පතු - ආකෘති 5B)	5,000	5,000
3514 වෙනත් සේවාවන් සැපයීම වෙනුවෙන් ලැබිය යුතු ගාස්තු	47,206	42,230
3402 කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ අත්තිකාරම්	14,198,252	12,438,630
3403 ආරක්ෂක තැන්පතු	228,310	227,200
3515 ආයෝජන මත ලැබිය යුතු පොලී	135,246	497,069
3518 අයවිය යුතු නේවාසික ගාස්තු	-	10,500
3520 අයවිය යුතු නිවාස කුලී	425,408	426,757
3521 ප්‍රකාශන අලෙවියෙන් ලැබූ මුදල	-	36,900
3523 සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම්	-	124,562
3524 ආහාර සඳහා කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුදල	7,510	5,230
3525 ආහාර සඳහා සමුපකාර පරීක්ෂකවරුන්ගේ අයවිය යුතු මුදල	130,896	130,896
3527 අයවිය යුතු උත්සව අත්තිකාරම්	39,000	31,000
3532 කාර්ය මණ්ඩල සඳහා අත්තිකාරම්	61,147	67,147
3535 ගිණුම් අතර මාරු කිරීම්	-	1,084,844
3539 එකතු කළ අගය මත බදු (Vat)	13,446,550	12,899,032
3540 රඳවා ගැනීම් බදු	249,964	273,527
3543 කාර්ය මණ්ඩලය සඳහා ණය	1,575,000	1,511,809
3544 කාර්ය මණ්ඩල ණය සඳහා අයවිය යුතු පොලී	-	-
3545 අගරු චෙක් පාලන ගිණුම	87,000	-
3548 අයවිය යුතු බස් ගාස්තු	-	22,306
3549 අයවිය යුතු ගොඩනැගිලි කුලී		242,250
අඩු/අඩමාන ණය සඳහා වෙන් කිරීම්	(152,693)	-
අඩමාන ණය සඳහා විශේෂ වෙන් කිරීම්	(130,896)	-
	34,306,691	**33,108,177**

සටහන - 06

	2010	2011
තොග		
3301 ලිපි ද්‍රව්‍ය	179,216	291,266
3302 මුද්‍රණ ද්‍රව්‍ය	334,071	485,616
3303 ගොඩනැගිලි ද්‍රව්‍ය	79,556	88,465
3304 ශ්‍රව්‍ය දෘෂ්‍ය ද්‍රව්‍ය	6,552	4,368
3305 විවිධ තොග	97,104	165,565
3306 ප්‍රකාශන - (පොත් හා සටහන්)	50,016	72,201
	746,517	1,107,482

		2010	2011
සටහන - 07		රු.	රු.
බැංකුවේ ඇති මුදල් (මහජන බැංකුව කටුගස්තොට)			
නේවාසික ගිණුම	0089 1001-72649555	31,106	3,024,237
විභාග ගිණුම i	0089 165 000304 8	3,996	3,996
ප්‍රකාශන ගිණුම	0089 1001-92649564	91,355	101,201
අධ්‍යාපන හා පුහුණු ගිණුම	0089-1001-32648143	694,868	2,032,781
ඵලදායිතා ගිණුම	089-1001-38092-967	408,085	1,202,148
රජයේ ගිණුම	0089-1001-92648140	31,734,507	27,652,257
සේවා ගාස්තු ගිණුම	0089-1001-5000-2158	**50,461**	**461,585**
ප්‍රකාශන ගිණුම ii		**3,417,039**	**17,039**
		36,431,417	**34,495,244**

	2010	2011
සටහන - 08		
ප්‍රාග්ධනය		
2001.01.01 දිනට ශේෂය	233,254,215	233,254,215
එකතු කිරීම්/ අඩු කිරීම්: ගැලපුම්	-	-
	233,254,215	**233,254,215**
සටහන - 09		
සමුච්චිත ලාභ/(පාඩු)		
ජනවාරි 01 දිනට ශේෂය	(63,793,304)	(71,637,899)
එකතු කිරීම්/ අඩු කිරීම් : පෙර වර්ෂයේ ගැලපීම්		
විගණන ගාස්තු	-	-
වෙනත්- එකතු කිරීම්	-	12,740
වෙනත්- අඩු කිරීම්	(551,383)	(674,921)
	(551,383)	**(662,181)**
පෙර වර්ෂයේ ගැලපීම්වලට පසු සමුච්චිත ලාභ/(පාඩු)	**(64,344,687)**	**(72,300,079)**
එකතුකලා : ආදායම ඉක්මවා ඇති වියදම්	(7,300,759)	(9,912,838)
	(7,300,759)	**(9,912,838)**
	(71,645,446)	**(82,212,917)**

	2010	2011
සටහන - 10		
භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		
01.01. දිනට ශේෂය	261,678,075	331,878,075
එකතු කිරීම්/අඩු කිරීම්	-	-
	261,678,075	**331,878,075**
එකතු කලා : වර්ෂය තුල ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්	70,200,000	2,000,000
	331,878,075	**333,878,075**
අඩු කලා : ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලදී ගත් වත්කම්වල ක්ෂයවීම්	-	-
	331,878,075	**333,878,075**

සටහන - 11

අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන

	2010 රු.	2011 රු.
01.01 දිනට ශේෂය	6,749,800	6,749,800
එකතුකලා : වර්ෂය සඳහා ලැබීම්	-	-
	6,749,800	**6,749,800**
අඩු කලා : ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලදී ගත් වත්කම්වල ක්ෂයවීම්	(3,358,408)	(3,908,408)
	3,391,392	**2,841,392**

සටහන - 12

ණය හිමියන් සහ උපචිත වියදම්

	2010	2011
4001 දුරකථන ගාස්තු	91,037	82,989
4002 ජල ගාස්තු	25,338	-
4003 විදුලි ගාස්තු	-	41,065
4004 දේශන ගාස්තු	206,660	124,295
4005 වෙනත් උපචිත වියදම්	1,107,888	222,063
4014 ගෙවිය යුතු රැඳවුම් මුදල්	-	-
4015 ගෙවිය යුතු රජයේ විගණන ගාස්තු	467,532	703,118
4016 භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු මුදල්	68,751	49,860
4018 බාහිර වැඩසටහන් සඳහා අත්තිකාරම් ලැබීම්	719,697	834,249
4019 ආරක්ෂක සේවා ගෙවීම්	139,696	216,600
4020 සනීපාරක්ෂක හා පවිත්‍රතා සේවා ගාස්තු	168,056	224,076
4021 ඇපිල්ලුම් සේවා ගෙවීම්	-	21,080
4022 ගොඩනැගිලි ඉදිකිරීම් වැය	867	-
ආකෘතිය : **10A අනුව) අත්තිකාරම් ලැබීම්**	447,225	2,509,536
4027 ණයහිමි ගෙවීම්	-	211,610
4035 වැටුප් පාලන ගිණුම (අනියම් සේවකයින්)	-	111,133
4040 ආපසු ගෙවිය යුතු පාඨමාලා ගාස්තු	36,600	100,358
4041 ඵලදායිතා පාලන ගිණුම	1,154,113	2,304,863
4044 වින්සි කේටර්ස්	100,462	-
4043 වැට් බද්ද	2,553,048	2,388,212
3903 ටෙන්ඩර් තැන්පතු	441,000	280,415
4048 ආහාර සැපයීම් සඳහා - රුචිර කේටර්ස්	67,309	-
4049 ගෙවිය යුතු ඉන්ධන ගාස්තු	50,487	100,742
4053 කලින් ලැබූ ගොඩනැගිලි කුලී ආදායම	153,750	-
4052 සතොස ආර්ථික සේවා (පුද්) සමාගමට ගෙවිය යුතු ආහාර ගාස්තු	-	1,623,142
	7,999,531	**12,149,420**

සටහන - 13

පුනරාවර්තන ප්‍රදානයන් (කේත අංක :11)

	2010	2011
1021 භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රතිපාදන	22,390,000	22,743,582
	22,390,000	**22,743,582**

සටහන - 14

අනෙකුත් ආදායම් (කේත අංක : 11)

	2010 රු.	2011 රු.
1001 - 1011 පාඨමාලා ගාස්තු - ආකෘති 14 - A	8,155,549	7,702,818
1013 නේවාසික ගාස්තු	-	-
1012 කාමර ගාස්තු	4,797,721	5,651,382
1014 දේශන ශාලා ගාස්තු	1,239,410	1,617,425
1015 නිවාස කුලී	285,000	304,350
1017 ප්‍රකාශන විකුණුම් ආදායම්	96,158	201,639
1018 සේවා ගාස්තු	4,450	12,400
1022 උපදේශන සේවා ගාස්තු	250,000	-
1023 මුද්‍රණ සේවා	299,569	204,129
1024 පුස්තකාල ගාස්තු	27,100	71,000
1025 විභාග ගාස්තු	137,715	115,297
1026 ස්ථාවර තැන්පතු පොලී	162,479	482,909
1027 කාර්ය මණ්ඩල ණය සඳහා පොලී	46,093	69,119
1035 ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු	23,798	13,500
1036 ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය	1,144,039	1,060,830
විවිධ ආදායම්- (ආකෘති 14-B)	1,285,933	2,113,265
1043 ආහාර සැපයීමේ කොමිස්	805,864	999,972
1065 කාර්ය සාධන තරඟාවලි වැඩ සටහන සඳහා ලියාපදිංචි ගාස්තු	1,225,600	-
1069 ගොඩනැගිලි කුලී	221,250	484,600
1063 ජාතිය ගොඩනැගීමේ බද්ද	436,903	315,996
	20,644,631	**21,420,631**

සටහන - 15

සේවක පිරිවැය (කේත අංක : 01)

	2010 රු.	2011 රු.
101 වැටුප් හා වේතන	13,285,973	12,677,439
151 දේශන ගාස්තු	1,522,380	2,316,325
103 අතිකාල දීමනා	739,694	948,068
104 දීමනා	1,252,099	1,671,114
105 සේවක අර්ථ සාධක අරමුදල (ආයතන දායකත්වය)	1,322,893	1,263,350
106 සේවක භාරකාර අරමුදල් දායකත්වය	264,579	252,670
153 විභාග අධීක්ෂණ ගාස්තු	38,000	45,900
154 පාඨමාලා සම්බන්ධීකරණ ගාස්තු	90,300	102,298
110 කළමනාකරණ මණ්ඩල සහභාගිත්ව දීමනා	22,000	100,000
112 නිවාඩු දින වැටුප් හා අනෙකුත්	95,744	71,539
155 ප්‍රශ්න පත්‍ර සැකසීමේ ගාස්තු	38,255	67,580
156 පිළිතුරු පත්‍ර බැලීමේ ගාස්තු	120,930	78,560
118 විශ්‍රාම පාරිතෝෂික දීමනා	448,278	520,418
119 විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායකත්වය	271,440	148,065
157 උපදේශක සේවා ගාස්තු	-	60,000
	19,512,564	**20,323,326**

සටහන - 16

ගමන් වියදම් (කේත අංක :02)	2010 රු.	2011 රු.
201 දිවයින ඇතුලත රාජකාරි ගමන් ගාස්තු	285,566	320,329
202 විදේශීය ගමන් ගාස්තු	467,862	1,183,067
	753,427	**1,503,396**

සටහන - 17

සැපයුම් හා කාර්යාලීය අවශ්‍යතා (කේත අංක : 03)		
301 ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	500,082	426,787
302 ඉන්ධන සහ ලිහිසි තෙල්	1,480,402	2,140,002
303 මුද්‍රණ ද්‍රව්‍ය	446,815	392,131
304 පුවත් පත් සහ වාර සඟරා	60,590	62,160
306 ආහාර වියදම්	955,209	674,426
307 යාන්ත්‍රික හා විදුලි උපකරණ	135,936	110,275
308 වීඩියෝ කැසට් සහ වෙනත්	2,268	2,738
310 වෙනත් සැපයුම්	229,541	109,919
312 බස්රථය සඳහා ඉන්ධන	-	-
313 වතුර බෝතල් ගාස්තු	91,490	87,665
314 ප්‍රකාශන මිලදී ගැනීම්	-	14,810
	3,902,331	**4,020,912**

සටහන - 18

නඩත්තු වියදම් (කේත අංක :04)		
401 රථවාහන	931,550	1,467,809
402 යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	518,462	541,314
403 ගොඩනැගිලි	633,477	1,002,855
404 ගෘහ භාණ්ඩ	172,075	16,350
405 පරිගණක සහ වෙනත්	-	-
406 රථවාහන බලපත්‍ර හා රක්ෂණ	150,389	97,099
	2,405,953	**3,125,426**

සටහන -19

ගිවිසුම්ගත ගත සේවා (කේත අංක : 05)		
501 ප්‍රවාහන	16,699	60,659
502 දුරකථන ගාස්තු	874,433	927,853
503 තැපැල් ගාස්තු	245,079	322,763
504 විදුලිය	1,895,723	2,307,627
505 ජලය	823,652	758,426
506 කුලී ගාස්තු	3,000	5,000
508 විගණන ගාස්තු	75,000	339,398
510 දැන්වීම් ප්‍රචාරණය	705,845	1,040,304
512 ආරක්ෂක සේවා	1,476,760	2,572,420
513 සනීපාරක්ෂක සේවා	1,706,713	2,328,832
514 ඇපුල්ලුම් සේවා	240,295	260,610
515 ගෙවතු පවිත්‍ර කිරීම්	4,850	1,400
516 රක්ෂණය	-	21,876
517 පරිවර්වර්ථන ගාස්තු	43,530	73,810
520 සේවක පුහුණුව (දේශීය/විදේශීය)	12,000	106,725
521 සාමාජික ගාස්තු	446,180	705,175
523 අනෙකුත් සේවා	316,544	258,732
524 මුද්‍රණ ගාස්තු මුද්‍රණ අංශය	43,756	129,868
525 මුද්‍රණ ගාස්තු - ශ්‍රව්‍ය දෘෂ්‍ය	14,728	27,245
526 මුද්දර ගාස්තු	1,995	-
529 සමුපකාර නිලධාරි පුහුණුව	260,115	503,172
	9,206,898	**12,751,894**

	2010	2011
සටහන -20	රු.	රු.
වෙනත් වියදම් (කේත අංක :06)		
601 හා 602 නීති ගාස්තු හා පරිත්‍යාග	11,500	11,464
607 සංග්‍රහ වියදම්	781,446	593,124
703 බැංකු ගාස්තු	40,595	22,424
705 කාර්ය මණ්ඩලය සඳහා වූ ණය මත පොලී	50,495	43,890
608 කාර්ය සාධන තරඟාවලිය	2,458,531	-
609 රාජ්‍ය භාෂා පුහුණුව ක්‍රියාත්මක කිරීම	11,200	62,400
707 ජාතිය ගොඩනැගීමේ බදු	829,082	429,394
709 ණය ගැතියන් සඳහා බොල් ණය වෙන් කිරීම්	72,733	-
	4,255,583	**1,162,696**

සටහන:5-A

ලැබිය යුතු පාඨමාලා ගාස්තු

	2010	2011
3501 සමුපකාර ඩිප්ලෝමාව	397,548	231,997
3502 සමුපකාර සහතික පත්‍ර පාඨමාලාව	1,248,089	56,170
3503 පුහුණු වැඩසටහන්	57,450	68,250
3506 කෙටිකාලීන වෙනත් පාඨමාලා	101,334	531,142
3508 NICD පරිගණක ඩිප්ලෝමා	142,000	30,250
3511 ඉංග්‍රීසි පාඨමාලාව	21,000	4,313
3512 තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාව	-	14,250
3522 පුස්තකාල හා විභාග ගාස්තු	86,758	25,000
	2,054,180	**961,372**

සටහන :5-B

තැන්පතු

	2010	2011
3536 ටෙන්ඩර් තැන්පතු	5,000	5,000
	5,000	5,000

සටහන :10-A

කලින් ලැබූ පාඨමාලා ගාස්තු

	2010	2011
4023 සමුපකාර ඩිප්ලෝමා පාඨමාලා	437,225	1,158,915
4024 කෙටි කාලීන වැඩසටහන්	-	565,837
4025 වෙනත් පාඨමාලා	10,000	784,785
	447,225	2,509,536

සටහන: 14-A

පාඨමාලා ගාස්තු ආදායම්

	2010	2011
	රු.	රු.
1001 සමුපකාර උසස් ඩිප්ලෝමාව	1,471,800	1,470,098
1002 NICD පරිගණක ඩිප්ලෝමාව	874,421	983,250
1003 පරිගණක සහතික පත්‍ර පාඨමාලාව	666,500	326,500
1004 ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව	234,708	274,688
1005 විශේෂ පාඨමාලා		
1005 -01 පාඨමාලා ගාස්තු ගණකාධිකරණ ශිල්පීය ආයතනය	-	46,200
1005 -02 පාඨමාලා ගාස්තු	-	70,500
1005 -03 පාඨමාලා ගාස්තු	-	81,000
1006 තොරතුරු තාක්ෂණ උපාධි වැඩසටහන	-	193,750
1007 සමුපකාර සහතික පත්‍ර පාඨමාලාව	964,918	639,341
1008 කෙටිකාලීන වැඩමුළු	2,524,140	2,088,350
1009 පරිගණක කෙටිකාලීන පාඨමාලා	96,000	494,196
1010 කෙටිකාලීන පාඨමාලා වෙනත්	1,323,062	950,515
1011 "කෝප් නෙට්" පුහුණු වැඩසටහන	-	84,430
	8,155,549	7,702,818

සටහන: 14-B

විවිධ ආදායම්

	2010	2011
1016 වත්තෙන් ලද ආදායම	62,125	31,248
1034 නේවාසික කළමනාකරණ දීමනා	76,603	96,926
1038 ඡායා පිටපත් ගාස්තු	48,943	17,751
1040 උපකරණ කුලී ගාස්තු	287,193	376,141
1041 වෙනත් සැපයුම්	-	7,250
1044 පානීය ජල බෝතල්	113,940	136,870
1045 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	95,000	82,750
1046 ඡායාරූප ආදායම්	23,400	67,025
1047 පුස්තකාල පොත් සඳහා දඩ මුදල්	23,470	10,825
1048 පොත් බැඳීම	6,250	4,870
1051 විවිධ ආදායම්	18,600	209,651
1056 බස් රථයෙන් ලද ආදායම	482,178	906,938
1061 අමතර ආදායම්	25,761	2,110
1062 හිමිකම් නොපෑ හිඟ ගාස්තු	22,470	146,411
1071 පුවත්පත් විකිණීම හා වෙනත් ප්‍රයෝජනයට ගත නොහැකි අයිතම්	-	16,500
	1,285,933	2,113,265

ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට, ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2012 දෙසැම්බර් 14 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට යොමුව	අනුකූල නොවීම
-----------------------------	-------------------

ප්‍රමිති 18

(i) වර්ෂ 05 කට වැඩි කාලපරිච්ඡේදයක් තුළදී පාවිච්චියෙන් ඉවත් කර තිබුණු ස්ථාවර වත්කම් වටිනාකම්, පොත්වලින් කපා හැරීම හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම හෝ කර නොතිබුණි.

(ii) වටිනාකම සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එහෙත් තවම භාවිතයේ පවතින ගත්මිල වටිනාකම රු. මිලියන 13.38 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

(iii) වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලය පදනම් කරගෙන පරිගණක හා පරිගණක උපාංග, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ,මෝටර් වාහන, පුස්තකාල පොත් යනාදී ස්ථාවර වත්කම් ක්ෂය කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්, උපලබ්ධි නොවූ චෙක්පත් , මුදල් ඇනවුම් , බැංකු සෘජු බැර , බැංකු සෘජු හර, අගරු චෙක්පත් , මුදල් පොතේ සංශෝධනය කළ යුතු ශේෂ , බැංකු ගාස්තු යනාදී විෂයයන් 08 කට අදාල එකතුව රු.424,781 ක් වූ නිරවුල් නොකල අගයන් වර්ෂ 05 කට වැඩි කාලයක සිට දිගින් දිගටම බැංකු ගිණුම් 05 කට අදාල බැංකු සැසඳුම්වල දක්වා තිබුණි. ඒවා සැසඳුම් කර නිරවුල් කිරීමට හා නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) නේවාසිකාගාර කාමර හා දේශන ශාලා සඳහා 2001 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුල මිලදී ගත් එකතුව රු.106,025 ක් වූ තිර රෙදි, ඇද ඇතිරිලි, මෙට්ට යනාදී පාරිභෝජ්‍ය ද්‍රව්‍ය , ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 01 සිට 05 දක්වා කාලයක් හිඟහිට තිබුණු පාඨමාලා ගාස්තු, බාහිර සේවා ගාස්තු, මුද්‍රණ ගාස්තු, ගොඩනැගිලි බදු කුලී හා ජල ගාස්තු එකතුව රු.1,312,326 ක් වූ ලැබිය යුතු ශේෂ 05 ක් අයකර ගෙන නොතිබුණි .

(ආ) 2011 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 කට වැඩි කාලයක් තුල සමුච්චිත වී තිබුණු රු. 13,446,550 ක් වූ ලැබිය යුතු එකතු කල අගය මත බදු (VAT) ශේෂ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයකර ගෙන නොතිබුණු අතර එම ගිණුම් ශේෂ වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ සැසඳුම් නොකර ගිණුම් වල දක්වා තිබුණි.

(ඇ) වර්ෂ 03 කට වැඩි කාලපරිච්ඡේදයක් තුළ ගිණුම් 04 ක සමුච්චිත වී තිබුණු රු.268,508 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට 2011 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව			අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය		
	(i)	xix පරිච්ඡේදයේ 5.3 වගන්තිය	උපලේඛණගත රජයේ නිවාසයක පදිංචි වීම වෙනුවෙන් සේවකයන්ගේ වැටුපෙන් 10 % ක් හෝ ආර්ථික කුලියක් අයකරනු වෙනුවට සුළු නාමික කුලියක් ආයතනය සතු නිල නිවාසවල පදිංචි සේවකයන්ගෙන් අය කර තිබුණි.
	(ii)	vii පරිච්ඡේදයේ 12 වගන්තිය හා 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	2011 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 2 කට වැඩි කාලයක් අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් කථිකාචාර්යවරයකුට විධිමත් නොවන පරිදි එකතුව රු.104,575 ක් වූ දීමනා ගෙවා තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
		මු .රෙ.756	වටිනාකම රු.64,056,244 ක් වූ ස්ථාවර වත්කම් සමීක්ෂණය කර සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුල ආයතනයේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.9,912,838 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,300,759 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය තවදුරටත් රු.2,612,079 කින් පිරිහී තිබුණි. සේවක වැටුප් හා දීමනා සහ ගිවිසුම්ගත සේවා ගෙවීම් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 වියදම්වල වැඩිවීම හා අඛණ්ඩ ඌනතාවය

2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ආයතනයේ වියදම් වැඩිවීම හා ඊට සාපේක්ෂව ආදායම අඩුවීමත් නිසා අඛණ්ඩව පැවති ඌනතාවය පිළිබඳ විස්තර පහත දැක්වේ.

	2011	2010	2009	2008	2007	2006	එකතුව
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
ආදායම් වියදම් ගිණුම අනුව ඌනතාවය	(9.91)	(7.30)	(6.17)	(4.14)	(7.61)	(8.88)	(44.01)
අඩු කළා : ක්ෂය වීම්	11.19	10.29	9.36	8.63	6.58	7.72	53.77
ක්ෂය ගැලපීමට පෙර අතිරික්තය/ (ඌනතාවය)	1.28	2.99	3.19	4.49	(1.03)	(1.16)	9.76

අඩු කළා :							
පුනරාවර්තන ප්‍රදාන	22.74	22.39	21.47	19.68	13.65	8.65	108.58
	---------	--------	---------	--------	--------	-------	----------
පුනරාවර්තන ප්‍රදාන හා ක්ෂය ගැලපීමට පෙර ඌනතාවය	(21.46)	(19.40)	(18.28)	(15.19)	(14.68)	(9.81)	(98.82)
	======	======	=====	=====	=====	=====	=====

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 සිට 2011 දක්වා වූ වර්ෂ 06 ක කාලය තුල ආයතනය ඉපැයූ ආදායම රු. මිලියන 98.82 කින් ඉක්මවා වියදම වැඩි වී තිබුණි.

(ii) 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වර්ෂ 06 ක කාලපරිච්ඡේදය තුල රජයේ ප්‍රදාන නොමැතිව ආයතනය රු.මිලියන 98.2 ක සමුච්චිත ඌනතාවයක් ලබා තිබුණද, රජයෙන් ලැබී තිබුණු රු.මිලියන 108.58 ක ප්‍රදාන නිසා එය වැලකී තිබුණි. මේ නිසා ආයතනයේ අඛණ්ඩ පැවැත්මේ අවිනිශ්චිතතාවය විගණනයේදී බැහැර කළ නොහැකි විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 4 වගන්තිය පරිදි ආයතනය සංස්ථාගත කිරීමෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත වූ පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි.

(i) සමුපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමට.

(ii) සමුපකාර සංවර්ධනයට අදාල දත්ත රැස්කිරීම අරභයා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම සහ රැස්කරන ලද දත්ත ප්‍රකාශනය කිරීම මගින් සංචයනය කිරීම හා පතල කිරීමට .

(iii) කළමනාකරණ නිපුණතා අවශ්‍යවන සමුපකාර ව්‍යවසායන් භාරගෙන කළමනාකරණය කිරීමට. හා

(iv) සමුපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් සැපයීමට.

(ආ) ආයතනය විසින් පවත්වන ලද පාඨමාලාවල ප්‍රගතිය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

පාඨමාලාව	2011 ඉලක්කගත පාඨමාලා සංඛ්‍යාව	2011 ඉලක්කගත පාඨමාලා ලාභීන් සංඛ්‍යාව	2011 තථ්‍ය පාඨමාලා සංඛ්‍යාව	2011 තථ්‍ය සහභාගී වූ පාඨමාලා ලාභීන් සංඛ්‍යාව	2010 තථ්‍ය පාඨමාලා සංඛ්‍යාව	2010 තථ්‍ය සහභාගී වූ පාඨමාලා ලාභීන් සංඛ්‍යාව
නිත්‍ය පුහුණු පාඨමාලා	02	83	03	110	02	97
උසස් ඩිප්ලෝමා පාඨමාලා	14	280	16	297	10	210
සහතික පත්‍ර පාඨමාලා	06	125	05	81	06	135
කෙටිකාලීන කළමණාකරණ සංවර්ධන පාඨමාලා	27	735	12	351	10	473
බාහිර ආයතනවල ඉල්ලුම මත පවත්වන ලද පාඨමාලා	-	-	16	682	34	1,347
සමුපකාර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නොමිලයේ පවත්වන ලද පාඨමාලා	-	-	08	380	14	498
බාහිර උපාධි හා වෘත්තීය ගිණුම්කරණ විභාග සඳහා උපකාරක වැඩ සටහන්	-	-	04	57	-	-
එකතුව	49	1,223	64	1,958	76	2,760

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(i) සමාලෝචිත වර්ෂයේ කෙටිකාලීන කළමනාකරණ සංවර්ධන පාඨමාලා පැවැත්වීමේ කාර්ය සාධනය 44 % ක් වූ අතර පාඨමාලා ලාභීන් සහභාගී වී තිබුණේ ඉලක්කගත සංඛ්‍යාවෙන් 48 % ක් පමණකි.

(ii) සමාලෝචිත වර්ෂයේදී සමුපකාර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නොමිලයේ පවත්වා තිබුණු පාඨමාලා සංඛ්‍යාව 08 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 43 % ක අඩුවීමකි.

(iii) සමාලෝචිත වර්ෂයේ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම හා පාඨමාලාලාභීන් සහභාගී කරවීමේ කාර්ය සාධනය පිළිවෙලින් 83 % ක් හා 65 % ක් විය.

(iv) බාහිර ආයතන වල ඉල්ලුම මත පාඨමාලා පැවැත්වීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අඩුවීම 53 % ක් විය.

(v) බාහිර උපාධි හා වෘත්තීය ගිණුම්කරණ විභාග සඳහා උපකාරක වැඩසටහන් පැවැත්වීම සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර තිබුණද, ඉලක්ක තීරණය කර නොතිබුණි. පවත්වා තිබුණු වැඩසටහන් 04 සඳහා සහභාගී වී තිබුණේ පුහුණු ලාභීන් 57 දෙනෙකු පමණකි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ආයතනය විසින් පැවැත්වූ පාඨමාලාවලින් ලද ආදායම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

පාඨමාලාව	2011	2010
--------------	------------------------	-----------

	ඉලක්කගත	තථ්‍ය	තථ්‍ය
	-------------	------	-------
	රු.	රු.	රු.
නිත්‍ය පුහුණු පාඨමාලා	559,860	429,598	551,736
උසස් ඩිප්ලෝමා පාඨමාලා	2,840,688	2.051,083	2,346,221
සහතික පත්‍ර පාඨමාලා	1,607,833	1,240,529	1,314,390
කෙටිකාලීන කළමනාකරණ පාඨමාලා	2,470.000	3,568,596	2,651,412
වෘත්තීය ගිණුම්කරණ විභාග සඳහා උපකාරක වැඩසටහන්	-	197,700	-
බාහිර උපාධි විභාග සඳහා උපකාරක වැඩසටහන්	-	193,750	-
	-------------	----------	----------
	7,478,381	7,681,256	6,863,759
	=======	=======	=======

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උසස් ඩිප්ලෝමා පාඨමාලා 14 ක් හා ඒ සඳහා පාඨමාලාලාභීන් සංඛ්‍යාව 280 ක් ලෙස අපේක්ෂිත ඉලක්කය ලෙස සඳහන් කර අපේක්ෂිත ආදායම රු.2,840,688 ක් ලෙස දක්වා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉලක්ක ගත පාඨමාලා සංඛ්‍යාව 02 කින් හා පාඨමාලාලාභීන් ගණන 17 කින් ඉක්මවා තිබුණත්, තථ්‍ය ආදායම ඉලක්කගත ආදායමට වඩා රු.789,605 කින් අඩු වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා මුළු ආදායම රු.817, 497 කින් එනම් 12 % කින් වර්ධනය වී තිබුණි.

4.2 අරමුදල් ඌන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රවනාගාරය ඉදිකිරීම් කටයුතුවල පැවති දීර්ඝ කාල ප්‍රමාදය හේතුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.27,652,257 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය නොකර බැංකු ජංගම ගිණුමේ වර්ෂ 02 ක පමණ කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) සමුපකාර ක්ෂේත්‍රයේ ජාතික එලදායිතා කාර්යසාධන තරඟ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාල ප්‍රමාදය හේතුවෙන් රාජ්‍ය බැංකුවකින් ලැබී තිබුණු රු. 1,202,148 ක් වූ ප්‍රදාන උපයෝජනය නොකර බැංකු ජංගම ගිණුමේ වර්ෂ 02 ක කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

බහු කාර්ය ගොඩනැගිල්ලේ බිම් මහලේ වාර්ෂික කුලී තක්සේරුව රු.390,000 ක් වුවත්, එය රු.195,000 ක වාර්ෂික කුලියක් මත 2010 අප්‍රේල් 01 දින සිට 2015 මාර්තු 31 දින දක්වා වර්ෂ 05 ක කාලයකට සමුපකාර සමිති සංගමයකට විධිමත් නොවන ලෙස බදු දී තිබුණි. මේ හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට කුලී ආදායම් ලෙස රු. 341,250 ක් ආයතනයට අහිමි වී තිබුණි.

4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

මුද්‍රණ අංශයට අයත් යන්ත්‍ර 3 ක් පාවිච්චියට නොගෙන වර්ෂ 10 කට වැඩි කාලයක් අභාවිතව පැවතුණි.

4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ශ්‍රවණාගාරය ඉදිකිරීම

ශ්‍රවණාගාරය ඉදිකිරීම රු. මිලියන 44.5 ක පිරිවැය ඇස්තමේන්තුවකට පෞද්ගලික ඉදිකිරීම් සමාගමකට 2001 අගෝස්තු මාසයේදී පවරා තිබුණි. ඉදිකිරීම් කටයුතු 2003 අප්‍රේල් මාසය වන විට අවසන් කළ යුතුව තිබුණද, වහලය ඉදි කිරීම් කටයුතු සිදු කෙරෙමින් පැවතියදී 2005 පෙබරවාරි 14 දින කඩා වැටීම නිසා ඉදි කිරීම් අතරමඟ නතර වී තිබුණි. කෙසේවෙතත්, වහලයේ සම්පූර්ණ ඉදිකිරීම්ද ඇතුළත්ව ඉතිරි වැඩ නිම කිරීම රු.මිලියන 113 ක් වූ නව පිරිවැය ඇස්තමේන්තුවකට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට 2009 වර්ෂයේදී පවරා තිබුණි. 2012 ජූලි 30 දින වන විටත් , ඉදිකිරීම් නිම කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වහලය කඩාවැටීම හේතුවෙන් සිදුව තිබූ අලාභය සම්බන්ධයෙන් ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයෙන් ලබා දී ඇති ආරවුල් නිරාකරණය කිරීමේ වාර්තාව හා අංක සීඅයිටී/4/4/8/2 දරන 2012 මැයි 31 දිනැති රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපිය අනුව, වහලය කඩා වැටීම නිසා

ආයතනයට සිදුව ඇති රු.3,907,904 ක් වූ අලාභය, ඉදිකිරීම් සඳහා උපදේශක සේවා සැපයූ උපදේශකවරියගෙන් හා ඉදිකිරීම් සමාගමෙන් (50 % බැගින්) අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට නියෝග කර තිබුණද, 2012 සැප්තැම්බර් 30 දින වන විටත් එම අලාභ අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ii) උපදේශක සේවා සැපයූ උපදේශකවරිය රාජ්‍ය සේවයේ නියුක්තව සිටියදී, මෙම ඉදිකිරීම් සඳහා අනවසරයෙන් පෞද්ගලික වශයෙන් උපදේශක සේවා සපයා රු.මිලියන 2.15 ක් වූ ගාස්තු ලබා ගැනීම සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට අදාල ආයතන දැනුවත් කර නොතිබුණි.

(iii) ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් නැවත ආරම්භ කර ඉදිකෙරෙමින් පැවතියදී, ඉදිකිරීම් සැලසුම් සංශෝධනය නිසා 2012 මැයි මාසයේදී ඉදිකිරීම් කටයුතු නැවතත් නතර වී තිබුණි. 2012 සැප්තැම්බර් 30 දින වන විටත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණු අතර නව ඉදිකිරීම් සැලසුම් අනුව රු.මිලියන 97.5 ක් වූ පිරිවැය ඇස්තමේන්තුව ලබාගැනීමට පමණක් කටයුතු කර තිබුණි.

(iv) ඉදිකිරීම් ආරම්භ කල 2001 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 11 ක දීර්ඝ කාල ප්‍රමාදය හා ඉදිකිරීම් සැලසුම් සංශෝධනය හේතුවෙන් රු. මිලියන 44.5 ක පිරිවැයකට නිමකල හැකිව තිබුණු ඉදිකිරීම මුළු පිරිවැය රු.මිලියන 255.0 ක් දක්වා එනම්, රු. මිලියන 210.5 කින් වැඩි වී තිබුණි.

(ආ) සේවා පහසුකම් ප්‍රසම්පාදනය

සමාලෝචිත වර්ෂයේදී ආරක්ෂක, පවිත්‍රතා, භෝජනාගාර යනාදී සේවා සැපයීම් ප්‍රසම්පාදන පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 වර්ෂය සඳහා ආරක්ෂක , පවිත්‍රතා , භෝජනාගාර යනාදී සේවා සැපයීම් කොන්ත්‍රාත්තු සඳහා ලංසු කැඳවා ලංසුකරුවන් තෝරාගෙන තිබියදී, එය නොසලකා ලංසු ඉදිරිපත් නොකල පුද්ගලික සමාගමකින් අවිධිමත් ලෙස ලබාගත් මිල ගණන් මත ඉහත කොන්ත්‍රාත්තු 03 ප්‍රදානය කිරීම හේතුවෙන් ආයතනයට වර්ෂයකට රු. 1,536,440 ක පාඩුවක් සිදුව තිබීම .

(ii) ඉහත සඳහන් අවිධිමත් තත්ත්වයක් තිබියදී 2012 වර්ෂය සඳහාද ලංසු කැඳවීමෙන් තොරව කොන්ත්‍රාත්තු ගිවිසුම් කාලය දීර්ඝ කර එම පුද්ගලික ආයතනයටම කොන්ත්‍රාත්තු 03 නැවතත් ප්‍රදානය කර තිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 59 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 35 ක් වූයෙන්, පුරප්පාඩු සංඛ්‍යාව 24 ක් විය. මෙම පුරප්පාඩු පිරවීම සඳහා මු .රෙ.71 ප්‍රකාර අනුමැතිය ලබා දී තිබුණද, එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද, 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2012 ජූලි 26 දිනදීය.

5.2 සංයුක්ත සැලැස්ම

2012 - 2016 වර්ෂ ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි පිලියෙල කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) හිඟහිටි ආදායම්

(ඇ) කොන්ත්‍රාත්තු පරිපාලනය

(ඇ) මානව සම්පත් කළමනාකරණය

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති.